# ගැටුම් නිරාකරණයෙහිලා මැදිහත්කරණ න්‍යාය (Mediation) පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත එළඹුම

කරඳගොල්ලේ සෝභිත හිමි

## හැඳින්වීම

භාරතීය සාහිත්‍යය විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ සුපෝෂිතව ලෝක සාහිත්‍යාවලිය තුළ අද්විතීය ස්ථානයක් හිමිකරගනී. නොයෙක් සාහිත්‍යාංගයන්ගෙන් උපලක්ෂිත තත් භාරතීය සාහිත්‍යයෙහි උපදේශ සාහිත්‍යයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. තත් උපදේශ සාහිත්‍යාවලිය තුළ අන්තර්ගත මහාර්ඝ ග්‍රන්ථ ද්වයක් වන **පඤ්චතන්ත්‍රය** හා **හිතෝපදේශය** නූගත් රාජ්‍ය පුත්‍රයන්ට නීතිශාස්ත්‍රය ඉගැන්වීම මුඛ්‍යාභිප්‍රාය කොට රචනා කොට ඇත. රාජ්‍ය පාලනයට අවශ්‍ය කරන දැනුමත් නීතිශාස්ත්‍රය පිළිබඳ දැනුමත් කථාන්දර සහ ශ්ලෝක උපයෝගී කරගෙන රාජපුත්‍රයන්ට ලබාදෙන්නේ අනාගතයේ රාජ්‍ය පාලන කටයුතුවලදී එමගින් අවශ්‍ය කරන මාර්ගෝපදේශකත්වය ලබාගැනීමට යි. එම කථාන්දර හා ශ්ලෝක මගින් රාජ්‍ය පාලනයේදී මුහුණදීමට සිදුවන හා විසඳීමට සිදුවන විවිධ ගැටුම්, එම ගැටුම් ඇතිවීමට මුල්වන හේතු, ගැටුම් නිරාකරණ කිරීම සහ නිරාකරණය සඳහා අවශ්‍ය කරන මාර්ගෝපදේශකත්වය ලබා දී ඇති නිසා ඒ ඒ අවස්ථාවන් තේරුම්ගෙන ගැටුමට අදාළ නිරාකරණ ප්‍රවේශය භාවිත කිරීමේ හැකියාව ලැබේ. එමෙන්ම ගැටුම් නිරාකරණය සඳහා උපයෝගී කරගැනීමට මාර්ගෝපදේශකත්වය සපයන න්‍යායාත්මක ක්‍රමවේදයන් රාශියක් ද හඳුනාගත හැකිවේ. මෙහිලා උත්සුක වනුයේ මැදිහත්කරණය මගින් ගැටුම් විසඳීම හා වළක්වා ගැනීම පිළිබඳ **පඤ්චතන්ත්‍රයේ** හා **හිතෝපදේශයේ** දක්නට ලැබෙන එළඹුම් පිළිබඳ විමර්ශනයක යෙදීමටයි. එහිලා ගැටුම් නිරාකරණය පිළිබඳ නූතන මැදිහත්කරණ න්‍යාය පිළිබඳ කෙටියෙන් සමාලෝචනය කොට උපදේශ සාහිත්‍යාගත එළඹුම පිළිබඳ විග්‍රහ කෙරේ.

**ගැටුම් නිරාකරණය පිළිබඳ නූතන මැදිහත්කරණ න්‍යාය**

ගැටුම් නිරාකරණය පිළිබඳ ක්‍රමවේදයන් අතර සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී ගැටුම් නිරාකරණයට භාවිත කළ ක්‍රමෝපාය වූයේ රාජ්‍ය මැදිහත්වීමයි. (State-Intervention) මෙම රාජ්‍ය මැදිහත්වීමේ ක්‍රියාපටිපාටියේ දී බහුල වශයෙන්ම යොදාගනු ලැබ ඇත්තේ බලපෑම් ඇති කිරීම (Coercive Power) හෙවත් බලයෙන් මෙන් සම්බන්ධතා ගොඩනැඟීමයි. බලය භාවිතයේ දී විශේෂයෙන් ප්‍රචණ්ඩකාරී ගැටුම්වල දී එම පාර්ශ්වකරුවන්ට අත් වූයේ ජය නැතහොත් පරාජය නම් වූ අනිවාර්යය ප්‍රතිඵලයයි. මෙවන් ගැටුම් අවස්ථාවක ගැටුමක පාර්ශ්වකරුවන් දෙදෙනාම අපේක්ෂා කරනුයේ ස්වකීය අභිලාෂයන් ජයග්‍රහණය කරගනිමින් අනෙක් පාර්ශ්වයේ අභිලාෂයන් (Interests) පරාජය කිරීම පමණකි. සැකෙවින් විග්‍රහ කරන්නේ නම් සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේ දී නියත වශයෙන්ම සිදුවූයේ අනෙකාගේ අපේක්ෂාවන්, අභිලාෂයන් හා උවමනාවන් පිළිබඳ කිසිදු තැකීමක් නොකර ස්වකීය අපේක්ෂාවන්, අභිලාෂයන් හා උවමනාවන් දිනාගැනීම සඳහා අවශ්‍ය කරන්නා වූ කටයුතු සිදුකිරීමයි **(කරුණාදාස, 2003: 28).**

එමෙන්ම ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේදී ගැටුමට මුහුණ දී සිටින පාර්ශ්වයන්ට තම අභිලාෂයන් හා අපේක්ෂාවන් ඉදිරිපත්කරමින් ගැටුම නිරාකරණය කරගැනීම සඳහා එකිනෙකා සම්බන්ධ කරවන ක්‍රියාවලියක් වශයෙන් සාකච්ඡාකරණය (Negotiation) හඳුනාගත හැකිය **(Uyangoda, 2003: 20).** ඒ අනුව ගැටුම් නිරාකරණ ක්‍රමවේදයක් වශයෙන් සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණයේදී සාකච්ඡා එළඹුමේ දී සිදුකරන්නේ ගැටුමකට සම්බන්ධ පාර්ශ්වකරුවන් අතර ඒ ගැටුම නිරවුල් කරගැනීම සම්බන්ධයෙන් එකඟත්වයකට පිවිසීම හෝ එවැනි එකඟත්වයකට පිවිසීමට ඉටාගැනීමේ ක්‍රියාවලියකි. සාම්ප්‍රදායික වශයෙන් රාජ්‍යයන් අතර සාකච්ඡා කිරීමෙන් ගැටලු නිරවුල් කරගැනීමේ ක්‍රමය භාවිත විය. සාකච්ඡාකරණයේ මූලික අරමුණ වන්නේ ගැටුම්කාරී දෙපාර්ශ්වයන් අතර එකඟතාවක් ඇති කිරීමයි.

සාකච්ඡාකරණය විචක්ෂණශීලීව හා ප්‍රයෝගකාරීව භාවිත කළයුතු උපක්‍රමයක් වශයෙන් සැලකේ. එසේ නැති වුවහොත් සාකච්ඡාකරණයෙන් බැසගත් විසඳුමට (Negotiated Settlement) ඒමට අපහසුය **(කරුණාදාස, 2003: 70).** ඒ අනුව සාකච්ඡාමය මැදිහත්වීමේදී, ගැටුමට පූර්වයෙන් පාර්ශ්වයන් තුළ පැවති රුචිකත්වයන් නැතහොත් ගැටුම් පාර්ශ්වකරුවන් මුල් අවස්ථාවේදී නිශ්චිත කරගෙන සිටි පිළිගැනීම් හෙවත් නිගමනයන් සාකච්ඡාකරණයට එළඹ සිටින්නවුන්ගේ අවධානයට ලක්වන අතර ඒ වෙනුවට නියමිත සමාජීය හා සංස්කෘතික පසුබිමක් තුළ පවත්නා හා දැඩිව ග්‍රහණය කරගෙන සිටින වටිනාකම් හා අපේක්ෂාවන් හඳුනාගෙන ඒවා අතරින් අභියෝගවලට ලක්වී තරඟ වැදී සිටින සමහර වටිනාකම් සහ අරමුණු සම්බන්ධයෙන් ප්‍රමුඛතාවන් සැකසීම ද එම පාර්ශ්වයන් විසින් සිදුකරනු ලැබේ **(කරුණාදාස, ඩබ්ලිව්. එම් 2003: 80-81).**

සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රමවේදයෙදී රාජ්‍යයන් විසින් අනුගමනය කළ ඉහත සඳහන් කරන ලද සාකච්ඡාමය ගැටුම් නිරාකරණ ක්‍රියාවලිය සඳහා උපකාර කරගෙන ඇත්තේ මැදිහත්කරණ ක්‍රියාවලියයි. අරගල හා ගැටුම් විසඳීම සඳහා අතීතයේ සිට මිනිසුන් විසින් භාවිත කරන ලද ඉතා සුවිශේෂී ක්‍රියාවලියකි, මැදිහත්කරණය **(Uyangoda, 2003: 29)**. ඒ අනුව මැදිහත්කරණය (Mediation) යනු පාර්ශ්වකරුවන් දෙදෙනෙකු අතර අරගලයක් (Dispute) හෝ ගැටුමක් (Conflict) ඇති කල්හි එය විසඳාගැනීමට, නිරාකරණය කරගැනීමට පාර්ශ්වකරුවන්ට උදව්දීම හෝ සහායවීම සඳහා ගැටුමට සම්බන්ධ නොවූ පිටස්තර පාර්ශ්වකරුවෙකු වශයෙන් මැදිහත්වෙමින් අතරමැදියෙකු සේ ක්‍රියා කිරීමයි. රාජ්‍යයන් විසින් සම්ප්‍රදායිකව ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා යොදාගත් මෙවැනි මැදිහත්කරුවෙකු හැඳින්වෙන්නේ ප්‍රධාන පාර්ශ්ව දෙකටම අයත් නොවන හෙයින් තුන්වැනි පාර්ශ්වකරුවෙකු (Third Party) වශයෙනි **(කරුණාදාස, 2003: 66).** මෙසේ තෙවන පාර්ශ්වය යැයි සඳහන් කිරීමේදී පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් හෝ නිල හෝ නිල නොවන සංවිධානයක් හෝ රාජ්‍යයක් හෝ ජාතික හෝ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් කෙරේ. බොහෝ විට තෙවන පාර්ශ්වය එක් ගැටුම් පාර්ශ්වයකගේ නැතහොත් දෙපාර්ශ්වයේම ආරාධනාව පරිදි මැදිහත්විය හැකිය. ඇතැම් ගැටුම්වලදී තෙවන

පාර්ශ්වය ස්වකැමැත්තෙන්ම ගැටුම් නිරාකරණය සඳහා මැදිහත් වේ **(සමරනායක, 2003: 25).**

ඒ අනුව තෙවන පාර්ශ්වයක් යනු සතුරු පාර්ශ්වයන්ට අන්‍යොන්‍ය වශයෙන් එකඟ විය හැකි ගිවිසුමකින් ආතතිය වෙනස් කිරීම සහ සතුරු පාර්ශ්වයන්ට විවෘතව සාකච්ඡා කිරීමට අදාළ පාර්ශ්ව අතර සම්බන්ධීකරණයක් ඇති කිරීමට සහාය වන්නන් වශයෙන් හඳුනාගත හැකි වෙයි (Lindgren, Nordquist and Wallensteen, 1993: 03). එමෙන්ම ඔවුන් විශේෂිත ගැටුමක් නිරාකරණය කිරීමට ක්‍රියා කිරීමේ දී උපදෙස් සපයන්නන් වශයෙන් ද හඳුන්වා ඇත. එහිලා ඔවුන් ගැටුම් නිරාකරණය කරගනුයේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන්ට උපදෙස් දෙනු ලැබේ **(Vayryen, 1991: 39).** පුළුල් වශයෙන් අවධානයට ලක්කිරීමේදී අභිලාෂ, විධික්‍රම සහ අගය කිරීම සඳහා කණ්ඩායම් අතර පවතින තරඟකාරිත්වය අන්‍යොන්‍ය වශයෙන් පිළිගත හැකි එකඟතා මගින් සාකච්ඡා මාර්ග යෙන් සමථකරණයට යොමු කරවීම තෙවැනි පාර්ශ්ව මැදිහත්වීමේ මූලික හරය වේ. එහිලා ඔවුන් තීරණය කරනු ලැබූ හෝ තීරණය කරනු ලබන සාධක ක්‍රියාකාරිත්වය සමඟ එකට සම්බන්ධ කිරීම හා නගා සිටුවීම සිදුකෙරේ **(ධම්මින්ද හිමි, 2003: 137-138).**

මේ අනුව ඉහත සඳහන් කළ ආකාරයට සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේදී ගැටුම් නිරාකරණයට මැදිහත්කරණ ක්‍රියාවලියට සම්බන්ධ වූ තුන්වන පාර්ශ්වකරුවන් වූයේ රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධානයන්ය. එහි රාජ්‍ය මැදිහත්වීම (State as a third party) ගැටුම් එසේ නොමැතිනම් ආරවුල් නිරාකරණ පාර්ශ්වයක් වශයෙන් මැදිහත්කරණය පිළිබඳ යොදාගන්නා ලද ක්‍රම දෙකකි.

| | | |
|---|---|---|
| රාජ්‍ය මැදිහත්කරණය | 1. බලාත්කාරයෙන් (Coercive) යුතු මැදිහත්වීම | බලය ශක්තිය, හමුදා බලය යෙදීම |
| | | බලයේ පීඩනය, දැඩි තෙරපීම යෙදීම |
| | 2. බලාත්කාරයෙන් (Non-Coercive) තොර මැදිහත්වීම<br><br>මෙම බලාත්කාරයෙන් තොර මැදිහත්වීමේ දී මැදිහත්කරු සතු බලය යෙදීම වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමයන් (Diplomatic techniques) යෙදීම සිදුකර ඇත. | බලයේ ආනුභාවය යෙදීම |
| | | 1. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග ගැනීම (Diplomatic Techniquse) |
| | | 2. මැදිහත්වීමේ ක්‍රියාමාර්ග ගැනීම (Mediation Techniquse) |
| | | 3. විභාගය කිරීමෙන් සමථකරණ ක්‍රියාමාර්ග ගැනීම (Concilation Techniquse) (කරුණාදාස, 2003: 69) |

එමෙන්ම තුන්වන පාර්ශ්වයක් වශයෙන් ජාත්‍යන්තර සංවිධානයන්හි සහභාගිත්වය ද සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණයේ දී දක්නට ලැබේ. ජාත්‍යන්තර සංවිධාන මැදිහත්වීමෙන් ගැටුම් නිරාකරණය කිරීමේදී සමථකරණය (Arbitration) හා විනිශ්චයකරණය (Adjudication) යන විධික්‍රමයන් භාවිත කර ඇත. සාම්ප්‍රදායික ක්‍රමවේදයට අනුව රාජ්‍යයන් අතර නීතිමය හා වෙනත් කිසියම් වූ ආරවුලක් පැන නැගුන අවස්ථාවන්හි භාවිත කරනු ලැබ ඇති පැරණිතම ක්‍රමය වී ඇත්තේ සමථකරණයයි. සමථකරණය තුළින් ආරවුල් නිරාකරණය සඳහා සමථකරණය පිළිබඳ ස්ථාවර අධිකරණය (Permenent Court of Arbitration) 1899 දී පැවැත්වූ හේග් සමුළුවේදී පිහිටවනු ලැබීය. එමෙන්ම ජාත්‍යන්තර සාමය උදෙසා පිහිටවනු

ලැබූ ජාතීන්ගේ සංගමය විසින් පළමුවරට විනිශ්චයකරණ ක්‍රමය හඳුන්වාදෙනු ලැබීය. ජාත්‍යන්තර යුක්තිය පිළිබඳ ස්ථාවර උසාවිය (Permenent Court of International Justice) යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර උසාවිය (International Court of Justice) ආදිය ඒ සඳහා උදාහරණ වෙයි **(කරුණාදාස, 2003: 67-77).**

විශේෂයෙන් ගැටුම් නිරාකරණය පිළිබඳ නූතන ප්‍රවේශයන් අනුව ගැටුම් නිරාකරණයට සම්බන්ධ වන්නේ රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධාන පමණක් නොවේ. ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන (NGO'S) වෘත්තිකයෝ, ශාස්ත්‍රඥයෝ ද සහභාගී වෙති. තව ද වර්තමානය වන විට පොදු ජන මට්ටමේ පුද්ගලයෝ ද සහභාගී වෙති. ඒ අනුව මෙම මැදිහත්වීමේ කාර්යභාරය සඳහා සම්බන්ධ වන කණ්ඩායම් වර්ගීකරණය කරන්නේ නම් එහි කොටස් 03ක් දක්නට ලැබේ.

ඉහළ මට්ටමේ නායකයෝ - රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, කලාපීය සංවිධාන, ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්හි ඉහළ පෙළේ නායකයන්

මධ්‍යම මට්ටමේ නායකයෝ - මීට අයත් වන්නේ රාජ්‍ය නොවන සංවිධාන (NGO'S) ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, පූජකවරුන්

පොදුජන මට්ටමේ නායකයෝ - මීට අයත් වන්නේ ප්‍රාදේශීය වශයෙන් නායකත්වය දරන ගම්මුලැදැනි, වෙදුන්, ගුරුවරුන් හා සමාජ සේවකයන් ආදීන් ය **(කරුණාදාස, 2003: 78).**

නූතන ප්‍රවේශයේදී තෙවන පාර්ශ්වයේ මැදිහත්වීම පුළුල් වන්නාසේම කාර්යභාරය ද සාම්ප්‍රදායික මැදිහත්වීමට වඩා ඉතා පුළුල් වූවකි. සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී මැදිහත්වීම සිදුවූයේ ගැටුම ආරම්භ වීමට පසුව වුවත් නූතන ප්‍රවේශයේදී එම මැදිහත්වීම සිදුවන්නේ ගැටුම ආරම්භවීමට පෙර සිටමය. එය ගැටුම පවත්නා කාලය තුළත් ගැටුම අවසන් වූ පසුත් පැවතිය යුතුය. එමෙන්ම ගැටුම් නිරාකරණයට මැදහත්වීමේදී සාම්ප්‍රදායික ප්‍රවේශයේදී මෙන් නොව බලාත්කාරයෙන්,

ප්‍රචණ්ඩත්වයෙන් තොරය. හිංසාව වෙනුවට අවිහිංසාවත් ගැටුම්වල බලපෑමට ලක්වන සියලු ජන කොටස්වල යුක්තිය, සාමය සහ සහයෝගීතාව තහවුරු කිරීමත් ප්‍රමුඛ කරගත් මැදිහත්වීමක් වන්නේය.

## මැදිහත්කරණ ක්‍රමවේදය (Mediation) පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත එළඹුම

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තොරතුරු මගින් ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරණය (Mediation) භාවිත කරන අතර නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී ද මෙම එළඹුම ගැටුම් නිරාකරණය සඳහා භාවිත කරන බව අවබෝධ කොටගත හැකිවෙයි. ගැටුම් ඇතිවන පාර්ශ්වකරුවන් අතර එකිනෙකා පිළිබඳ අවබෝධය ඇති කොට අදාළ ගැටුම නිරාකරණයට පත් කිරීමටත් ගැටුම් නිරාකරණය සඳහා පිහිට සොයා යා යුතු පුද්ගලයන් හෝ කණ්ඩායම් පිළිබඳ අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීමටත් මැදිහත්කරණ න්‍යායාය උපයෝගී වන බව සංස්කෘත උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදයේ දී උපයුක්ත වන අතර නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී ද එය අවධාරණය කරයි. මෙයින් ගැටුමට මුහුණ දී සිටින පාර්ශ්වකරුවන්ට තම අවශ්‍යතාව තේරුම් ගැනීමට හා එළඹිය හැකි විසඳුම් පිළිබඳ අවබෝධකර ගැනීමට අවශ්‍ය කරන පහසුකම් සැපයීම පිළිබඳ වැඩිමනත් අවධානය යොමු කොට ඇත. විශේෂයෙන් මෙහිලා ගැටුම් නිරාකරණයට මැදිහත් වන තුන්වන පාර්ශ්වකරු වශයෙන් රාජ්‍යයක්, පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක මැදිහත්වීම දැකිය හැකිය. එමෙන්ම සාම්ප්‍රදායික ප්‍රවේශයේ දී ද උපයුක්ත මෙම තුන්වන පාර්ශ්වකරුවන් යොදාගන්නා ලද ක්‍රමවේදයන් දෙකක් දැකිය හැකි වෙයි.

| ක්‍රමවේදය | මැදිහත්කරු | මැදිහත්කරණ ස්වභාවය | යොදාගත් ශිල්පීය ක්‍රමය |
|---|---|---|---|
| නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදය | රාජ්‍ය මැදිහත්කරණය | 1. බලාත්කාරයෙන් (Coercive) යුතු මැදිහත්වීම | බලය ශක්තිය, හමුදා බලය යෙදීම |
| | | | බලයේ පීඩනය, දැඩි තෙරපීම යෙදීම |
| | | | බලයේ ආනුභාවය යෙදීම |
| | | 2. බලාත්කාරයෙන් (Non-Coercive) තොර මැදිහත්වීම<br>විශේෂයෙන් මෙම බලාත්කාරයෙන් තොර මැදිහත්වීමේ දී බලය වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමයන් (Diplomatic techniques) යෙදීම සිදුකර ඇත. | 1. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග ගැනීම (Diplomatic Techniqu<br>se) |
| | | | 2. මැදිහත්වීමේ ක්‍රියාමාර්ග (Mediation Techniquse) |
| | | | 3. විභාගය කිරීමෙන් සමථකරණ ක්‍රියාමාර්ග (Concilation Techniquse) (කරුණාදාස, ඩබ්ලිව්.එම් 2003: 69) |
| උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදය | කිසියම් පුද්ගලයෙක් (ඇතැම් විට එක් පාර්ශ්වකරුවෙකුගේ ඉල්ලීම මත) | බලාත්කාරයෙන් යුතු මැදිහත්වීම | මැදිහත්වන පුද්ගලයාගේ බලවන්තභාවය උපයෝගී කරගැනීම |
| | | | පාර්ශ්වකරුවන්ගේ බලපෑමක් නැතිව තුන්වන පාර්ශ්වයක් විසින් තම වාසිය පිණිස බලාධිකාරය පවත්වාගෙන එළඹීම |
| | | බලාත්කාරයෙන් තොර මැදිහත්වීම | රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග ගැනීම |
| | | | මැදිහත්වීමේ ක්‍රියාමාර්ග |
| | | | විභාගය කිරීමෙන් සමථකරණ ක්‍රියාමාර්ග |

යථෝක්ත ක්‍රමවේදයන් උපයෝගී කරගෙන ගැටුම් විසඳීමට තුන්වන පාර්ශ්වකරුවන් කටයුතු කර ඇති ආකාරය සංස්කෘත උපදේශ සාහිත්‍යයේ අන්තර්ගත සංසිද්ධීන් ඔස්සේ අපට පැහැදිලිව ස්ඵුට කරගත හැකිය.

**බලාත්කාරයෙන් යුතු මැදිහත්කරණය**

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත බලාත්කාරයෙන් යුතු මැදිහත්කරණයේ අවස්ථා දෙකක් දැකිය හැකිවෙයි. ඉන් පළමු වැන්න නම්, මැදිහත්වන පුද්ගලයාගේ බලවන්තභාවය උපයෝගී කරගෙන ප්‍රතිවාදී පාර්ශ්වකරු මැඩලීමට පත්කර එක් පාර්ශ්වයකට ජයග්‍රහණය අත්කර ගැනීම. එහිදී භාවිත කර ඇති ක්‍රමවේදය වන්නේ කෞටිල්‍ය නීති ශාස්ත්‍රයේ සඳහන් සංශ්‍රය නම් උපක්‍රමය යොදා ගැනීමයි **(Pañcatantra of Viṣṇuśarman 1912: काकोलुकीयम्, P 139-140).** (සංශ්‍රය නම් තමාට වඩා බලවත් ප්‍රතිවාදියෙක් සිටින විට එම ප්‍රතිවාදියා හා සටන් කළ හැකි බලවත් අයෙකුගේ සහාය පැතීමයි **(කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය, දෙවන කොටස, (සංස්.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, (කොළඹ: ඇස් ගොඩගේ සහෝදරයෝ, 2003), පිටුව 265-269).** එනම් ගැටුමට මුල් වී සිටින පාර්ශ්වකරුවන් අතුරින් එක් පාර්ශ්වකරුවෙකු ගැටුම ඇති කරගෙන ඇති අනෙක් පාර්ශ්වකරුවාට වඩා බලවත් පුද්ගලයෙකු යොදා ගෙන තම ප්‍රතිවාදියා පරාජයට පත්කර ගැටුම නිරාකරණය කර ගැනීමට උත්සාහ කිරීම මෙහිදි දැකිය හැකිය. **පඤ්චතන්ත්‍රයේ** ලබ්ධප්‍රණාශ කාණ්ඩයේ එන ගංගදත්ත නම් මැඩියා පිළිබඳ කථාවේ සඳහන් පරිදි තම සතුරු නෑයන් මැඩලීමට ගංගදත්ත භාවිත කොට ඇත්තේ මෙම මැදිහත්කරණ උපක්‍රමයයි. එය සැකෙවින් මෙසේ ය.

"කිසියම් ළඳක ගංගදත්ත නම් මැඩි රජෙක් වාසය කරයි. ඔහුගේ නෑදෑයන් දිනක් ඔහුට නින්දා කරන්නේ ඔවුන්ගෙන් පළිගැනීමට අදහස් කරයි. ඒ අනුව එම නෑයන් තමන්ට වඩා බලවත් හෙයින් ඔවුන් නැසීමට ඔවුන්ට වඩා බලසම්පන්න ප්‍රියදර්ශන නම් සර්පයා යොදා ගැනීමට කල්පනා කරයි. ඒ අනුව ප්‍රියදර්ශන නම් සර්පයා ඒ සඳහා එකඟ කරගෙන එම සර්පයා මැඩියන් වෙසෙන ළිඳට කැඳවාගෙන ගොස් ඔහුට වාසය කිරීමට අවශ්‍ය කරන පහසුකම් සපයා දී තමාට විරුද්ධකම් කරන නෑයන් විනාශයට පැමිණවීමට

අවශ්‍ය කටයුතු කරන අතර තමාට අයත් වර්ගයා නොමරන ලෙසට නියමයක් ද කරයි. ටික දිනකින් ප්‍රියදර්ශනයා ගංගදත්තගේ සතුරන් විනාශ කොට ගංගදත්තගේ පිරිස ද එකිනෙකා ආහාරයට ගනී. ගංගදත්ත එයට විරුද්ධ වී එසේ නොකොට එම ස්ථානයෙන් ආපසු යන ලෙස ප්‍රියදර්ශනට ප්‍රකාශ කරන විට 'තමන් සිටි වාසස්ථානය අතහැර පැමිණි හෙයින් එය අනෙකෙකු විසින් අයත් කරගෙන ඇති හෙයින් නැවත එහි යා නොහැකි බවත් නුඹ විසින් මා මෙහි ගෙන ආවේ නම් තමන් රැක ගැනීම හා අවශ්‍ය පහසුකම් සැපයීම ගංගදත්තගේ යුතුකමක් හා වගකීමක් බවත් පවසා' ගංගදත්තගේ පිරිස ද ආහාරයට ගත්තේ ය. ටික දිනකින් ගංගදත්තගේ ඥාති වර්ගයා ද අවසන් වී හුදෙක් ගංගදත්ත පමණක් ඉතිරි වෙයි. 'තමාට කෙසේ හෝ ආහාර සපයා දිය යුතු ය නැතහොත් නුඹ ද ආහාරයට ගන්නෙමි.' යැයි ප්‍රියදර්ශන පැවසූ හෙයින් 'මැඩියන් රැගෙන එන්නෙමි.' යැයි ප්‍රියදර්ශනට පවසා ගංගදත්ත එම ළිඳෙන් නික්ම බේරී පළායයි. දින කිහිපයක් ගිය ද නැවත නො ආ හෙයින් ගංගදත්තට හෝ නැවත පැමිණෙන්න යැයි යහළුවන් මාර්ගයෙන් ප්‍රියදර්ශන ගංගදත්තට පණිවුඩ යවන නමුත් ගංගදත්ත නැවත එහි නොපැමිණෙයි'' **(Pañcatantra of Viṣṇuśarman 1912**: लब्धप्रणाशम् **, P 194-198).**

විශේෂයෙන් සාම්ප්‍රදායික මැදිහත්වීමේ ක්‍රියාවලියේ දී සංස්කෘත උපදේශ සාහිත්‍යාගත උක්ත කථාවෙන් මැදිහත්කරණය පිළිබඳ ඉතා වැදගත් උපදේශයක් ලබාදෙයි. එනම් ගැටුම් වළක්වා ගැනීමට තම ජයග්‍රහණය තහවුරු කරගැනීමට තමන්ට වඩා බලසම්පන්න අයෙකු යොදා ප්‍රතිවාදියා නැති කළ පසු එම මැදිහත්කරු තමාගෙන් සේවය ලබාගත් පුද්ගලයාගේ, පුද්ගල කණ්ඩායමේ හෝ රාජ්‍යයේ දුබලතාවන් අවබෝධ කරගෙන එය ද සිය අණසක යටතට ගැනීමට උත්සාහ කරන බවයි. එහෙයින් ගැටුම් නිරාකරණය කරගැනීමට, ගැටුම් වළක්වාලීමට හා ප්‍රතිවාදීන් මෙල්ල කරන්නට තුන්වන පාර්ශ්වකරුවෙකු වශයෙන් මැදිහත්කරණය සඳහා තෝරාගන්නා පාර්ශ්වකරු ඉතා විශ්වාස කටයුතු අයෙකු විය යුතු බව අවධාරණය කර දක්වයි. එසේ නොවුනහොත් තමන් ද එම මැදිහත්කරුගේ බලයට යටත් වීම හේතුවෙන් ස්වකීය ස්වාධිපත්‍යය අහිමිකර ගැනීමට සිදුවන බව අවධාරණය කෙරේ.

උක්ත මැදිහත්කරණය පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත මාර්ගෝපදේශනය සර්වකාලීන වූවකි. එය නූතන ලෝකයේ ඇතිවන ගැටුම් නිරාකරණ ක්‍රියාවලියෙහි දී ද ඉතා අවධානයට ගත යුතු කරුණක් වී තිබේ. වර්තමානයේ ලෝකයේ රටවල් අතර මෙන්ම අභ්‍යන්තර වශයෙන් ඇතිවන ගැටුම් නිරාකරණය කිරීම සඳහා මැදිහත්කරුවන් වශයෙන් තොරාගනු ලබන හෝ ඉදිරිපත් වන ඇතැම් විට රාජ්‍යයන් එමෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් මැදිහත්කරණයට වඩා ඔවුන්ගේ පුද්ගලික අභිමතාර්ථයන් උදෙසා ඇතැම් රටවල්වලට සිදුකරන බලපෑම ඉතා බරපතල වන අතරම එම මැදිහත්කරණය නිසාම පසුකාලීනව මුහුණදීමට සිදුවන ප්‍රශ්න ඉතා බරපතල වී ඇත. එනිසා ගැටුම් නිරාකරණය විෂයෙහි මැදිහත්කරුවන් තෝරා ගැනීමේදී සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් ලබාදෙන උක්ත මාර්ගෝපදේශනය නූතන ගැටුම් නිරාකරණ ක්‍රමවේදයෙහි මැදිහත්කරණ ක්‍රියාවලියෙහි ලා ඉතා අවධානයට ගතයුතු කරුණක් වන බව නො අනුමාන ය.

එමෙන්ම සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ මැදිහත්වීමේ ක්‍රියාවලියේ දී සංස්කෘත උපදේශ සාහිත්‍යයේ විශේෂයෙන් දැකිය හැකි බලාත්කාරයෙන් යුතු මැදිහත්කරණයේ දෙවන අවස්ථාව නම්, ගැටුමට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ බලපෑමක් නැතිව තුන්වන පාර්ශ්වයක් විසින් තම වාසිය පිණිස බලාධිකාරය පවත්වාගෙන ගැටුමට මුල් වී සිටින පාර්ශ්වකරුවන්ට කරුණු අවබෝධ කරදී ගැටුම නිරාකරණය කිරීම යි.

**පඤ්චතන්ත්‍රයේ** මිත්‍රභේද කාණ්ඩයේ සහ **හිතෝපදේශයේ** සුහෘද්භේද කාණ්ඩයේ සඳහන් පරිදි සංජීවකගේ හඬ අසා ව්‍යාකුල වූ මනසින් සිටින පිංගලකගේ මානසික අසහනය දුරුකරවමින් සංජීවක හා පිංගලක අතර මිත්‍රත්වය ඇතිකිරීම සඳහා දමනක නම් සිවලා මැදිහත්කරුවෙකු වශයෙන් කටයුතු කරයි. **පඤ්චතන්ත්‍රයේ** සඳහන් පරිදි දමනක සංජීවක වෘෂභයා පිංගලක සිංහයා වෙත රැගෙන යාමට කටයුතු කරන්නේ කිසියම් වූ බලාධිකාරයක් තමන්වෙත ආරූඪ කරගෙන සංජීවක කෙරෙහි වක්‍රාකාරයෙන් යම් බලපෑමක් ද එල්ල කරමිනුයි. එනම් 'පිංගලක ස්වාමියා සමඟ මිත්‍රත්වය ඇතිකරගත් පසු තමන් පිළිබඳ නොසලකා හැරීම සිදු නොකළ යුතු බවත් එසේ කළහොත් දන්තිල සිටුවරයාට සිදු වූ දෙය සිදු විය හැකි බවත් එනම්

''උත්සව අවස්ථාවක ගෝරම්භට අවමන් වන ලෙස ක්‍රියා කළ හෙයින් දන්තිල විෂයෙහි රජුගේ සැකය හා අප්‍රසාදය ඇතිවන ප්‍රකාශ කරමින් දන්තිලට රජුගෙන් ලැබුණු වරප්‍රසාද නතර වන තැනට ගෝරම්භ කටයුතු කිරීමයි.'' (මෙම සම්පූර්ණ කථාව මෙහි සමගිකරණය නම් අනු මාතෘකාව යටතේ දක්වා ඇත.) පවසන්නේ සංජීවක විෂයෙහි කිසියම් වක්‍රාකාරයෙන් තර්ජනයක් ද සිදුකරමින් ය **(Pañcatantra of Viṣṇuśarman 1912: मित्रभेदम् , P 22)**. එම තර්ජනය පසුව සත්‍ය වූ දෙයක් බවට පත්වන්නේ පිංගලකගේ හා සංජීවකගේ මිත්‍ර සන්ථවය නිසා කරටක දමනක ආදීන්ට අවශ්‍ය කරන ආහාර හා සත්කාර සම්මාන නොලැබීම හේතුවෙන් කේලාම් කියා සංජීවක හා පිංගලක අතරෙහි අවිශ්වාසය ඇති කොට දෙදෙනා සටනකට යොමු කරවමින් පිංගලක අතින් සංජීවක මරණයට ලක්කරවීමෙනි **(Pañcatantra of Viṣṇuśarman 1912: मित्रभेदम् , P 91)**.

ඉහත සඳහන් කථාවලින් පැහැදිලි වන්නේ නූතන සාම්ප්‍රදායික බලාත්කාරයෙන් යුතු මැදිහත්කරණ ක්‍රියාවලියට සමාන වන ආකාරයේ මැදිහත්කරණයන් සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තොරතුරුවලින් ද හඳුනාගත හැකි බවයි. විශේෂයෙන් එහි සඳහන් පරිදි මැදිහත්කරුවන් පිළිබඳ වැඩි අවධානයක් දැක්වීමට පාර්ශ්වකරුවන්ට සිදුවන බව අවධාරණය කරයි. එයට හේතුවන්නේ තම ප්‍රශ්නය විසඳාගැනීමට මැදිහත්කර ගන්නා තමාට වඩා බලසම්පන්න පුද්ගලයා අවසානයේ තමන්ට ද බලපෑම් එල්ල කරමින් වාසි ප්‍රයෝජන ලබාගැනීමට උත්සුක වන බව තහවුරු කිරීම යි. එමෙන්ම තෙවන පාර්ශ්වකරු ගැටුමට මුල් වී සිටින පාර්ශ්වයන්ට මුහුණපා ඇති ගැටලුව විසඳාගැනීමට උපකාර කරන, මගපෙන්වීම් කරන ස්වභාවයෙන් ඒ සඳහා ස්වකැමැත්තෙන් ම ඉදිරිපත් වුව ද එයින් විවිධ වාසිප්‍රයෝජන අපේක්ෂා කරන බවත් එම අපේක්ෂාවන් ඉටුනොවන තැනදී විවිධාකාරයේ අකටයුතුකම් කරමින් සමගිව වෙසෙන පාර්ශ්වයන් අසමගි කොට ඔවුනොවුන් අතර විරෝධාකල්පයන් ඇතිකරවීමට උත්සුක වන බව ද දැඩි ලෙස අවධාරණය කරයි. ඒ අනුව නූතන සාම්ප්‍රදායික බලහත්කාරයෙන් යුතු මැදිහත්කරණය හා උපදේශ සාහිත්‍යාගත මැදිහත්කරණය පිළිබඳ පහත තොරතුරු හඳුනාගත හැකිවෙයි.

| බලහත්කාරයෙන් යුතු මැදිහත්වීම | ප්‍රධාන පාර්ශ්වකරු | මැදිහත් වූ ස්වභාවය හෙවත් යොදාගත් ශිල්පීය ක්‍රමය | අවසන් ප්‍රතිඵලය හා දක්නට ලැබෙන සුවිශේෂත්වයන් | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිඵලය | විශේෂත්වය |
| ප්‍රධාන සාම්ප්‍රදායික ක්‍රමවේදය | කිසියම් වූ රාජ්‍යයක් | 1.බලය ශක්තිය, හමුදා බලය යෙදීම<br>2.බලයේ පීඩනය, දැඩි තෙරපීම යෙදීම<br>3.බලයේ ආනුභාවය යෙදීම (කරුණාදාස, ඩබ්ලිව්.එම් 2003: 69) | තම බලය යොදා ගැටුම නිරවුල් කිරීමයි. එහි ප්‍රතිඵලය ජය-පරාජය (Zero-Sum) ලැබීමයි. | එයින් ගැටුමට මුල්වී සිටින පාර්ශ්වකරුවන්ගේ ස්වකීය අභිලාෂයන් ඉටුනොවේ. |
| උපදේශ සහිතායතන ක්‍රමවේදය | කිසියම් පුද්ගලයෙක් එක් පාර්ශ්වකරුවෙකුගේ ඉල්ලීම මත | තම බලවන්තභාවය ප්‍රබලතාව (බාහු බලය) යොදාගැනීම | තම බලවන්තභාවය උපයෝගී කරගෙන තම පාර්ශ්වකරුට ජය අත්කරදීම. | එක් පාර්ශ්වකරුවෙකු පරාජය වෙයි.<br>තමන් මැදිහත්කරගත් පුද්ගලයා ද අතික්‍රමණය කරයි. එනම් මැදිහත් වූ තෙවන පාර්ශ්වකරු තමන් ජයග්‍රහණය කරවූ පුද්ගලයාට බලපෑම් එල්ල කිරීම. |
| | කිසියම් පුද්ගලයෙක් ස්වකීය කැමැත්තෙන් | තම වාසිය පණිසා බලාධිකාරයක් පවත්වා ගනිමින් | දෙපිරිසටම ජය අත්වෙයි. | ගැටුමට මුල්වී සිටි දෙපිරිසගෙන්ම අනාගත වාසි බලාපොරොත්තුවෙන් කටයුතු කරයි.<br>එමෙන්ම තම බලාපොරොත්තු ඉටු නොවන විට තමන් සමගි කළ පාර්ශ්වයන්ම භේද භින්න කොට තම අභිමතාර්ථයන් සඵල කරගැනීම. |

**බලාත්කාරයෙන් තොර මැදිහත්කරණය**

මෙම මැදිහත්කරණ ක්‍රියාවලියට අනුව සංස්කෘත උපදේශ සාහිත්‍යයේ දී මෙන්ම සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී ද උපයෝගී කරගෙන ඇත්තේ බලය යෙදීම වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමයන් යොදාගෙන ගැටුම් නිරාකරණය කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම යි. මෙහිදී භාවිත කොට ඇති ක්‍රම ශිල්ප නැතහොත් න්‍යායය කිහිපයකි.

| ක්‍රමවේදය | මැදිහත්කරණ ස්වභාවය | යොදාගත් ශිල්පීය ක්‍රමය |
|---|---|---|
| නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදය | 2. බලහත්කාරයෙන් (Non-Coercive) තොර මැදිහත්වීම<br>විශේෂයෙන් මෙම බලහත්කාරයෙන් තොර මැදිහත්වීමේ දී බලය වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමයන් (Diplomatic techniques) යෙදීම සිදුකර ඇත. | 1. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග ගැනීම (Diplomatic Techniques) |
| | | 2.මැදිහත්වීමේ ක්‍රියාමාර්ග (Mediation Techniques) මෙය හැඳින්වීමට<br>i. සාකච්ඡාකරණය (Negotiation)<br>ii. මැදිහත්වීම (Mediation)<br>iii. සමගිකරණය (Conciliation)<br>iv. නිලය භාවිත කිරීම (Good Office)<br>v. පහසුකම් සැපයීම (Facilitation)<br>vi. විමසීම් කිරීම (Enquiry) යන වචන යොදාගෙන ඇත. එයින් මැදිහත්වීමේ ආකාරය එකිනෙකට වෙනස් ස්වරූප ගන්නා ආකාරය දක්නට ලැබේ. |
| | | 3. විභාගය කිරීමෙන් සමථකරණ ක්‍රියාමාර්ග (Concilation Techniques) **(කරුණාදාස, ඩබ්ලිව්.එම් 2003: 69)** |
| උපදේශ සාහිත්‍යගත ක්‍රමවේදය | බලාත්කාරයෙන් තොර මැදිහත්වීම | 1. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග ගැනීම |
| | | 2. මැදිහත්වීමේ ක්‍රියාමාර්ග<br>i. මැදිහත්වීම ii. සමගිකරණය iii. නිලය භාවිත කිරීම |
| | | 3. විභාගය කිරීමෙන් සමථකරණ ක්‍රියාමාර්ග |


**රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා මාර්ග ගැනීම**

මෙම ක්‍රියාවලියේදී අනුගමනය කර ඇත්තේ ගැටුම් හෝ ආරවුල් ඇති වූ අවස්ථාවන්හි එයට මුහුණ දී සිටින පාර්ශ්වයන්ට අදාළ රාජ්‍ය නියෝජිතයන් නැතහොත් නම් කරන ලද තානාපතියෙකු, දූතයෙකු මාර්ගයෙන් ඍජුවම උපදේශක මට්ටමේ ද්විපාර්ශ්වික වූ සාකච්ඡා පවත්වා දෙපාර්ශ්වයේ ම අවශ්‍යතාවන් පිළිබඳ මැනවින් වටහාගෙන ගැටුම් නිරාකරණය කොට අදාළ පාර්ශ්වයන් අතර සාමදානය ඇති කිරීමයි. ඒ අනුව මෙහිදී සිදු කර ඇත්තේ බාහිර වෙනත් රාජ්‍යයක හෝ පුද්ගලයන්ගේ මැදිහත්වීමකින් තොරව ගැටුමට මුහුණ දී සිටින රාජ්‍යයන් හෝ පුද්ගල කණ්ඩායම්වල නියෝජිතයන් මැදිහත් වී සාකච්ඡා මාර්ගයෙන් ගැටලුව නිරාකරණය කිරීම යි.

හිතෝපදේශයේ සන්ධි කාණ්ඩයේ සඳහන් පරිදි චිත්‍රවර්ණ නම් මොණර රජුත් හිරණ්‍යගර්භ නම් හංස රජුත් අතර ඇති වූ යුද්ධයෙන් පසු දෙපක්ෂයේම සේනාව විනාශ වූ අවස්ථාවේ මධ්‍යස්ථ අදහස් ඇති චිත්‍රවර්ණගේ ප්‍රධාන ඇමතියා වූ දූරදර්ශී නම් ගිජුලිහිණියාත් හිරණ්‍යගර්භගේ ඇමතියා වූ සර්වඥ නම් සක්වාලිහිණියාත් යන දෙදෙනා රාජ්‍ය නියෝජිතයන් වශයෙන් එකතුව සාකච්ඡා පවත්වති. මෙම දෙදෙනාම සිය රජවරුන්ගේ අභිවෘද්ධිය අපේක්ෂා කරන රාජ නිතීන් පිළිබඳ මනා අවබෝධයක් ඇති ඇමතිවරු වෙති. එම දෙදෙනා දෙපාර්ශ්වයේ ගැටුම නිරාකරණය කරමින් රජවරුන් දෙදෙනා අතර සමගි සන්ධානය ඇති කරමින් තම තමන්ගේ රාජ්‍යයන් ලැබ එහි වගකීම ගෙන කටයුතු කිරීමට අවස්ථාව සලසයි **(Hitopadeśa of Nārāyaṇa, 1967: संधिः, P 86-105).** ඒ අනුව බලාත්කාරයෙන් තොර රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීමෙන් ගැටුම් නිරාකරණය කිරීමට හැකි බව සහ ඒ සඳහා අවශ්‍ය කරන ක්‍රමවේදය සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් අවධාරණය කර ඇති බව පැහැදිලි වෙයි.

විශේෂයෙන් නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී භාවිත රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමේ ක්‍රියාවලිය මගින් ලබන ප්‍රතිඵලයන්ට වඩා සංස්කෘත උපදේශ සාහිත්‍යාගත ක්‍රියාවලියේ දී ලද ප්‍රතිඵලය සාර්ථක වී ඇත. එයට හේතුවන්නේ ඒ සඳහා යොමුවන නියෝජිතයන්ගේ දක්ෂකම හා අවශ්‍ය කරුණු කාරණා තේරුම් ගැනීමේ හැකියාවෙන්

යුක්ත අය වීමයි. එහෙයින් සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් ලබාදෙන එම මාර්ගෝපදේශනය නූතනයට අදාළ කරගැනීම ගැටුම් නිරාකරණ විෂයෙහි ඉතා ඵලදායි වන බව සඳහන් කිරීම යුක්ති යුක්ත ය.




## මැදිහත්කරණය

මෙම මැදිහත්කරණය ක්‍රියා මාර්ගයෙන් ගැටුම් හා ආරවුල් විසඳීමට සිදුකරන මැදිහත්වීම අපේක්ෂා කෙරේ. සංස්කෘත උපදේශ සාහිත්‍යයේ දී,

i. මැදිහත්වීම,

ii. සමගිකරණය කිරීම

iii. නිලතත්ත්වය භාවිත කිරීම

වැනි ක්‍රමවේදයන් භාවිත කර ඇති ආකාරය අපට දක්නට ලැබෙයි. නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේදී ඉහත වගුවේ දක්වා ඇති ආකාරයට එම මැදිහත්වීමේ ස්වරූපය දැක්වීමට විවිධ වචන භාවිත කර ඇති අතර එයින් සිදුවන කාර්යය භාරය ද එකිනෙකට වෙනස් ස්වරූපයක් ගන්නා බව අවධාරණය කෙරේ. එයට අදාළව, ඒ අනුව ඒ එකිනෙකින් ද අර්ථවත් වන්නේ තුන්වන පාර්ශ්වයක් විසින් කරනු ලබන මැදිහත්වීමේ ස්වරූපය එකිනෙකට වෙනස් වන බවයි.

### i. මැදිහත්වීම

මෙම මැදිහත්වීම යටතේ නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේදී සිදුව ඇත්තේ පාර්ශ්වයන් දෙකක් හෝ කිහිපයක් අතර ගැටුම් නිරාකරණයේ ඇණහිටීමක් සිදුව ඇති අවස්ථාවන්හි වෙනත් පාර්ශ්වයක් එයට මැදිහත්වීමයි. ස්වේච්ඡාමය මැදිහත්වීමක් වූ එයින් සිදුකරනුයේ දෙපාර්ශ්වයටම පිළිගත හැකි විසඳුමක් ඉදිරිපත් කිරීමයි. (වර්තමානයේ උතුරු හා දකුණු කොරියානු අර්බුදය විසඳීම සඳහා ඇමරිකාවේ මැදිහත්වීම මෙහිලා උදාහරණ වශයෙන් දැක්විය හැකිවෙයි. එමෙන්ම ශ්‍රී ලංකා රජය හා කොටි ත්‍රස්තවාදීන් අතර 2002-2003 වර්ෂයන්හි සාම සාකච්ඡා පැවැත්වීම සඳහා නෝර්වේ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ මැදිහත්වීම ද උදාහරණ වශයෙන් සඳහන් කළ හැකි ය. (මෙම අර්බුද හා සිදුවීම් ඉතා දීර්ඝ කාලයක් පවතින ඒවා වන අතර ඒ පිළිබඳ පුළුල් වශයෙන් සාකච්ඡා කිරීම උගහට ය.) උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදයේ දී එම මැදිහත්වීම නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයට සමානව මෙන්ම තරමක් වෙනස් ස්වරූපයක් ද ගෙන ඇත. නූතන ක්‍රියාවලියට තරමක් වෙනස් සංස්කෘත උපදේශ සාහිත්‍යාගත මැදිහත්වීමේදී ගැටුමක් ඇතිවීමට හේතු හටගන්නා මුල් අවස්ථාවේම ගැටුමට මුල්වන පාර්ශ්වකරුවන්ට කරුණු වටහා දී ගැටුම ඇතිවීම වළක්වාලීමට කටයුතු කිරීම සිදුවෙයි. එහිදි තුන්වන පාර්ශ්වයක් මගින් බල කිරීමකින් තොරව ගැටුමට මුල්වී සිටින පාර්ශ්වකරුවන් අතරින් එක් පාර්ශ්වයකට ඇති වී ඇති තත්ත්වය පිළිබඳ අවබෝධය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරයි. නමුත් නූතන ක්‍රමවේදයේ දී සිදුකරනුයේ දෙපාර්ශ්වයේම එකඟතාව මත තෙවැනි පාර්ශ්වකරුවෙකු ඉදිරිපත්වීමයි. **පඤ්චතන්ත්‍රයේ** ලබ්ධප්‍රණාශයේ අන්තර්ගත සිංහ පැටවුන් අතර ඇතිදැඩි වූ සිවල් පැටවාගේ කථාවෙන් එය මැනවින් පැහැදිලි වෙයි.

''කිසියම් පෙදෙසක සිංහ යුවළක් වාසය කළහ. ඉක්බිති සිංහ ධේනුව පුතුන් දෙදෙනෙකු ප්‍රසූත කළා ය. සිංහයා ද නිතරම සිව්පාවුන් මරා සිංහ ධේනුවට දෙයි. එක් දිනයක ඔහු විසින්, කිසිම සතෙකු නො ලබන ලදි. වනයෙහි හැසිරෙන්නා වූ ඔහුට හිරු ද අවරට ගියේය (ඔහුට රෑ විය). ඉක්බිති සිය නිවසට එන ඔහු විසින් සිවල් පැටියෙක් ලබන ලදි. ඔහු ද මේ පැටියෙක් යැයි සලකා උත්සාහයෙන් දළ මැදට

කොට ගෙන (දත්වලින් අල්ලාගෙන) පණ පිටින්ම සිංහ ධේනුවට පිළිගන්වන ලදි. ඉක්බිති, සිංහධේනුව විසින් කියන ලදි. පිනවත් ස්වාමීනි, නුඹ. අපට කිසියම් අහරක් ගෙන ආවෙහි ද? සිංහයා කීවේ ය. ප්‍රියාවනි, අද මා විසින් මේ සිවල් පැටියා හැර කිසියම් සතෙකු නො ලබන ලදි. කියන ලද්දේ වෙයි.

දැන් නුඹ මොහු අනුභව කොට සැනසීමට පත් වන්න. උදෑසන වෙන සතෙක් අල්ලා ගන්නෙමි. ඇය කීවා ය. 'ස්වාමීනි, නුඹ විසින් මොහු පැටවෙකු යැයි සිතා නො නසන ලදි. එනිසා මම තම උදර පෝෂණය සඳහා මොහු කෙසේ විනාශ කරම් ද?' එනිසා මොහු මගේ තෙවැනි පුත්‍රයා වන්නේ ය. යැයි කියා ස්වකීය තන කිරෙන් ඒ අනෙකා පෝෂණය කළා ය. මෙසේ ඒ ළදරුවෝ තිදෙනා එකිනෙකාට නො දක්නා ලද ජාතිය පිළිබඳ වෙනස ඇත්තහු එකට හැසිරෙන්නාහු බාලකාලය ගෙවන්නාහු ය. ඉක්බිති, කිසියම් දිනක ඒ වනයෙහි හැසිරෙන්නාහු වල් ඇතෙක් පැමිණියේ ය. ඌ දැක යම්විටෙක ඒ සිංහ පුත්‍රයො දෙදෙනා කුපිත වූ මුව ඇත්තාහූ ඌ වෙතට පැන්නාහු ද? එවිට ඒ සිවලා විසින් කියන ලදි. අහෝ මේ ඇතෙකි. ඔබලාගේ පාරම්පරික සතුරෙකි. එනිසා මූ සමීපයට නොයා යුතු ය. මෙසේ කියා ගෙට දිව්වේය. ඔවුහු දෙදෙනාත් වැඩිමහල් සහෝදරයාගේ පලායාමෙන් උත්සාහ රහිත වූවන් බවට ගියාහු ය.

ඉක්බිති ඒ සහෝදරයෝ දෙදෙනා ගෙට පැමිණ පියා ඉදිරියෙහි සිනාසෙන්නාහූ වැඩිමහල් සොහොයුරාගේ ක්‍රියාව කිවාහු ය. යම්සේ මොහු දැක දුරදීම පලා ගියේ ය. ඔහු ද එය අසා කොවින් ඇවිසුණු සිත් ඇත්තේ වෙව්ලන තොල් සඟල ඇත්තේ හැකිළුණු ඇස් ඇත්තේ දෙබැම ත්‍රිශූලයක් මෙන් කොට ඔවුන් දෙදෙනාට නින්දා කරන්නේ ඉතා රළු වචන කීවේ ය. අනතුරුව සිංහ ධේනුව විසින් හෙතෙම පසෙකට කැඳවා දන්වන ලදි. දරුව, කිසි දිනක මෙසේ කථා නොකරව මේ දෙදෙන ඔබගේ බාල සහෝදරයෝ ය යැයි. ඉක්බිති, හෙතෙම අතිශය කෝපයට පත් වූයේ ඇයට කීවේ ය. යම්හෙයකින්, මා උපහාස කරනු ලබන්නේ කිම මම ශූරභාවයෙන් රූපයෙන් විද්‍යාවන් හැදෑරීමෙන් කුසලභාවයෙන් හෝ මොවුනට වඩා හීන ද? එනිසා මවිසින් නිසැකවම මොවුන් දෙදෙනා නැසිය යුතු ය. එය අසා ඔහුගේ ජීවිතය කැමැත්තා වූ සිංහධේනුව සිනා සී කීවා ය.

පුත්‍රය, ශූරයෙක් වෙහි. හදාරන ලද ශිල්ප ඇත්තෙ වෙහි. දැකුම්කළු වෙහි. යම් කුලයෙක්හි නුඹ උපන්නේ වීද ඒ කුලයෙහි ඇතුන් නො නසනු ලැබේ.

එනිසා, මනාකොට අසව. දරුව නුඹ සිවලියකගේ පැටියෙකි. කරුණාවෙන් මා විසින් ස්වකීය තන කිරිවලින් පෝෂණය කරන ලදි. එනිසා යම්තාක් මේ මගේ දරුවන් දෙදෙනා විසින් ළදරු බව නිසා නුඹ සිවලෙකු ලෙස නො දන්නා ලද ද එතාක් වහා ගොස් ස්වකීයයන් මැද සැඟවෙන්න. එහෙම නොවුනොත්, මොවුන් දෙදෙනා විසින් මරන ලදුව මරු වසඟයට යන්නෙහිය. ඔහු ද එම වචනය අසා බියෙන් තැතිගත් සිතැත්තේ සෙමින් සෙමින් පැනගොස් තම රැළට එකතුවිය'' **(Pañcatantra of Viṣṇuśarman 1912: लब्धप्रणाशम्, P 202-204).**

මෙම කථාවට අනුව සිංහපැටවුන් හා සිවලා අතර ඇතිවීමට ගිය ගැටුම සිංහ ධේනුව මැදිහත් වී වළක්වාලයි. නූතන ක්‍රමවේදයට අනුව ගැටුම් නිරාකරණය ඇණහිටි අවස්ථාවේ තෙවැනි පාර්ශ්වකරුවෙකුගේ මැදිහත්වීම දෙපාර්ශ්වයේ එකඟතාව මත සිදු වුව ද සංස්කෘත උපදේශ සාහිත්‍යයේ අන්තර්ගත ක්‍රියාවලියට අනුව ගැටුමක් ඇති වීමට අවශ්‍ය කරන වටපිටාව සැකසෙන විට එක්පාර්ශ්වයක සහභාගිත්වයෙන් තුන්වන පාර්ශ්වයක් එයට මැදිහත් වී එම ආරවුල විසඳීමට කටයුතු කරන ආකාරය මෙමගින් ගම්‍යමාන වෙයි.

එමෙන්ම නූතන සාම්ප්‍රදායික ක්‍රියාවලියේ දී සංස්කෘත උපදේශ සාහිත්‍යයට සමානව ම ගැටුම් ඇති කරගත් පාර්ශ්වකරුවන්ගේ එකඟතාවෙන් ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරුවෙක් වශයෙන් තෙවැනි පාර්ශ්වයකගේ සහාය ලබාගැනීමත් ඔහු විසින් ඉදිරිපත් කරන ලද විසඳුම දෙපාර්ශ්වයම පිළිගන්නා අයුරුත් දක්නට ලැබේ. එහි විශේෂත්වය වන්නේ තෙවැනි පාර්ශ්වකරු ඉදිරිපත් කරන ගැටුම්කාරී පාර්ශ්වයන් දෙදෙනාම පිළිගත් විසඳුමෙන් ගැටුම්කාරී පාර්ශ්වයන් දෙකම විනාශයට පත්වන අවස්ථාවන් ද දක්නට ලැබීමයි. එයින් නූතන මැදිහත්කරණ ක්‍රියාවලියේ දී ද අවධාරිත 'අත්වන ප්‍රතිඵලය පිළිබඳ තෙවැනි පාර්ශ්වය වග නොකියන අතර වාසි අවාසි දෙපාර්ශ්වය දරාගත යුතුය.' යන්න ප්‍රත්‍යක්ෂ වන අයුරු දක්නට ලැබේ. ඒ සඳහා

උදාහරණ සපයන හිතෝපදේශයේ සන්ධි කාණ්ඩයේ එන කථාවක් මෙසේය.

''පෙර සුන්දය උපසුන්දය නම් සහෝදර වූ අසුරයෝ දෙදෙනෙක් මහත් කාය වෙහෙසීමෙන් තුන්ලෝකයේ රාජ්‍ය කැමැත්තෙන් බොහෝකලක පටන් ඊශ්වර තෙමේ සතුටු කළහ. ඉකිබිතිව ඊශ්වරතෙමේ ඔවුන් දෙදෙනාට සතුටු වූයේ වරයක් ඉල්ලව් යැයි කියේ ය. අනතුරුව ඔවුන් දෙදෙනාට ආවේශ වූ සරස්වතිය ඔවුන්දෙදෙනාගේ කැමැත්ත වෙනස් කොට වෙනත් දෙයක් කීමට සැලැස්වූවාය. ඒ අනුව ඔවුන් දෙදෙනා 'ඉදින් භගවත් වූ ඊශ්වර තෙමේ අපදෙදෙනාට සතුටු වූයේ නම් එකල්හි ස්වකීය භාර්යාව වූ උමාදේවිය දේවායි කීහ.' අනතුරුව කිපුණු ඊශ්වර විසින් වරයදීම අවශ්‍යයෙන්ම කළයුතු බැවින් ද මුළාවී ඇති බැවින් ද උමාදේවී දෙන ලද්දී ය. ඉක්බිති උමාවගේ රූපසෞන්දර්යයෙහි ලොල්වූවාහු ද ලෝකය නසන්නාවූ උඩගු සිත් ඇත්තාවූ ද පාපාන්ධකාරයට පැමැණියාවූ ද (උමාව) මගේ මගේ යැයි ඔවුනොවුන් කලහකරන්නවුන් දෙදෙනා විසින් කිසියම් සුදුසු පුරුෂයෙක් විචාරනු ලැබේවා යි. අදහස ඇති කල්හි එම ඊශ්වරතෙමේ ම මහලු බමුණු වෙස් පැමිණ එහි එළඹ සිටියේය. අනතුරුව (ඔවුහු දෙදෙනා) මැය අප දෙදෙනා විසින් තම බලයෙන් ලබන ලද්දී ය. මෝතොමෝ අප දෙදෙනාගෙන් කවරෙකුට අයත් වේදැයි බ්‍රාහ්මණයා අතින් විචාළෝ ය. බ්‍රාහ්මණයා කියයි.

'විද්‍යාවෙන් අධික වූ බ්‍රාහ්මණයා ද, ශක්තිමත් වූ ක්‍ෂත්‍රිය තෙමේ ද, ධනධාන්‍යයෙන් අධික වූ වෛශ්‍යයා ද පිදිය යුත්තේ වෙයි. ශුද්‍රතෙමේ වනාහි බමුණන් සේවනය කිරීමෙන් පිදිය යුත්තේ වෙයි.'

එහෙයින් තෙපිදෙදෙනා ක්‍ෂත්‍රිය ධර්මය ඇත්තෝ වෙත්. 'තෙපිදෙදෙනාට යුද්ධය ම නියම වෙයි.' මෙසේ කියන කල්හි මොහු විසින් යහපතක් කියන ලද්දේ යයි කොට ඔවුනොවුන් සමාන වීර්යය ඇත්තාහු එකවිට ඔවුනොවුන් නැසීමෙන් විනාශයට පැමිණියාහු ය'' **(Hitopadeśa of Nārāyaṇa, संधिः, P 92/ හිතෝපදේශය, 343-435).**

උක්ත කථාවෙන් ගැටුමට මුල් වී සිටි පාර්ශ්වකරුවන් දෙදෙනා දෙපාර්ශ්වයේම එකඟතාව මත මැදිහත්කරුවෙකු වශයෙන් තෙවැනි පාර්ශ්වයක මැදිහත්වීම ලබාගත් අතර මැදිහත්කරු ලබාදුන් විසඳුම දෙදෙනාම පිළිගත් අතර එම විසඳුමට අදාළ ක්‍රියාවලියෙහි යෙදීමෙන්

දෙදෙනාම විනාශයට පත්වූහ. එම මැදිහත්වීමෙන් ලද විසඳුමෙන් අත්වන ප්‍රතිඵලය පිළිබඳ තෙවැනි පාර්ශ්වය වග නොකියන ලද අතර වාසි අවාසි දෙපාර්ශ්වයට දරාගැනීමට සිදුවිය. සංස්කෘත උපදේශ සාහිත්‍යාගත උක්ත කථාවෙහි තෙවැනි පාර්ශ්වයේ තත් මැදිහත්වීමත් එහි ප්‍රතිඵලයත් නූතන සාම්ප්‍රදායික මැදිහත්වීමේ ක්‍රියාවලියට සමාන වෙයි. ඒ අනුව නූතන ක්‍රියාවලිය සංස්කෘත උපදේශ සාහිත්‍යය මගින් රාජ පාලනයෙහි ලා ශත වර්ෂ ගණනාවකට පෙර සිට ම උගන්වන ලද හා අවධාරණය කරන ලද්දක් බව ප්‍රත්‍යක්ෂ වෙයි.

ඒ අනුව නූතන හා සංස්කෘත උපදේශ සාහිත්‍යාගත මැදිහත්වීමේ ක්‍රමවේදයෙහි ස්වභාවය පිළිබඳ පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කළ හැකිය.

| ක්‍රමවේදය | මැදිහත්වී ඇති ආකාරය | විශේෂත්වයන් |
|---|---|---|
| නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදය | 1. පාර්ශ්වයන් දෙකක් හෝ කිහිපයක් අතර ගැටුම් නිරාකරණයේ ඇණහිටීමක් සිදුව ඇති අවස්ථාවන්හි<br>2. ස්වේච්ඡාමය මැදිහත්වීමකි. | 1. දෙපාර්ශ්වයේම එකඟතාව මත තෙවැනි පාර්ශ්වකරුවෙකු ඉදිරිපත්වීම<br>2. අත්වන ප්‍රතිඵලය පිළිබඳ තෙවැනි පාර්ශ්වය වග නොකියන අතර වාසි අවාසි දෙපාර්ශ්වය දරාගත යුතුය. |
| උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදය | 1. ස්වේච්ඡාමය මැදිහත්වීමකි.<br>2. ගැටුමක් නිර්මාණය වන බව අවබෝධ කොටගත් මොහොතේ ම ඉදිරිපත්වීම | **නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයට සමාන වන ක්‍රමවේදයේ විශේෂතා**<br>1. දෙපාර්ශ්වයේ ම එකඟතාව මත තෙවැනි පාර්ශ්වකරුවෙකු ඉදිරිපත්වීම<br>2. අත්වන ප්‍රතිඵලය පිළිබඳ තෙවැනි පාර්ශ්වය වග නොකියන අතර වාසි අවාසි දෙපාර්ශ්වය දරාගත යුතුය.<br>**උපදේශ සාහිත්‍යයට පමණක් ආවේණික ක්‍රමවේදයේ විශේෂතා**<br>1. තුන්වන පාර්ශ්වයක් මගින් බල කිරීමකින් තොරව ගැටුමට මුල්වී සිටින පාර්ශ්වකරුවන් අතරින් එක් පාර්ශ්වයකට ඇති වී ඇති තත්වය පිළිබඳ අවබෝධය ලබාදීම<br>2. ගැටුමක් ඇති නොකර ගෙන එක් පාර්ශ්වකරුවෙකු එයින් ඉවත්ව යාම.<br>3. තෙවැනි පාර්ශ්වයේ මැදිහත්වීම ඵලදායි වීම. |

## ii. සමගිකරණය

මෙමගින් අපේක්ෂා කර ඇත්තේ ගැටුම් ඇති කරගන්නා ලද පාර්ශ්වකරුවන් අතර හොඳ හිත වර්ධනය වන අයුරින් ඔවුන් එතෙක් එකිනෙකා කෙරෙහි දැරූ ආකල්පයන් වෙනස් කිරීමට සෘජුව හෝ වක්‍ර වශයෙන් අවශ්‍ය පසුබිම සකසාදීමට අදාළ කාර්යභාරය තුන්වන පාර්ශ්වකරුවෙකු විසින් සිදුකිරීමයි. **පඤ්චතන්ත්‍රයේ** මිත්‍රභේද කාණ්ඩයේ අන්තර්ගත දන්තිල ගෝරම්භ කථාවේ ගෝරම්භ විසින් දන්තිල පිළිබඳ රජුගේ සිතෙහි අවිශ්වාසය ඇති කර භේද කරන අතර පසුව ඔහුම රජුත් දන්තිලත් සමගි කිරීමට අවශ්‍ය කරන පසුබිම ද උපක්‍රමශීලීව සකසයි. එය සැකවින් මෙසේ ය.

''වර්ධමාන නම් නගරයක දන්තිල නම් සිටුවරයෙක් අධිපතිව වාසය කරයි. රාජ්‍ය සේවයෙහි මෙන්ම වෙළෙඳාමෙහි ද දක්ෂ නිසා මොහුට රටවැසියා ඉතා ගෞරව කළහ. දන්තිලගේ දියණියගේ විවාහ උත්සවය සඳහා මැති ඇමතිවරු ආදි ප්‍රභූන් මෙවන් රජගෙ දර සේවකයන් ද ගෙන්වීය. එම සේවකයන් අතර රජගෙදර අමඳින ගෝරම්භ නම් සේවකයාද විය. මේ ගෝරම්භයා මැති ඇමතිවරුන් ඉදිරියේ උස් ආසනයක හිඳගත් හෙයින් දන්තිල විසින් ගෝරම්භයාගේ බෙල්ලෙන් අල්ලා මැදුරෙන් නෙරපන ලදි.

එයින් ලැබූ නින්දාව නිසා දන්තිලගෙන් පළිගැනීමට නිතර කල්පනා කරන ගෝරම්භ දිනක් උදෑසන රජුගේ සිරියහන් ගබඩාව අමඳිමින් ''රජ මෙහෙසිය වැළඳගැනීමෙන් දන්තිල සිටුතුමා දක්වන නිර්භීතකම හා අහංකාර අහෝ ! විස්මයජනකයි.'' කීවේය. අඩ නින්දේ සිටි රජතුමා මෙය අසා මහත් කම්පාවට පත්ව තා විසින් කියන ලද්දේ සත්‍යයක් ද කියව. කිම දන්තිලයා විසින් මෙහෙසිය වැළඳ ගන්නා ලද්දේ දැයි කුපිතව ඇසීය. දේවයන් වහන්ස, පසුගිය රාත්‍රියෙහි බොහෝවේලා නිදිමරමින් සූදුකෙළියෙහි යෙදුන නිසා බලවත් ලෙස නින්ද එයි. ඉබේම නෙත් පියවේ. කුමක් කියවුනේ දැයි මම නොදනිමියි ගෝරම්භයා කීවේය.

මෙහිදී රජු නිහඬව දහවල් කාලයේ කරන ලද දේ රාත්‍රියෙහි නින්දෙන් කියයි. මේ ආදි වශයෙන් මෙය සැබැවින්ම සිදුවූ දෙයක් යැයි ද ස්ත්‍රීන්ගේ දොස් ද සිතා දන්තිල මාලිගාවට පැමිණීම වළක්වා කරන ලද සියලු සංග්‍රහ ද නතර කළේය.

එයින් අතිශය දුකට පත් දන්තිල තෙමේ මෙයට හේතුව කුමක්දැයි සොයා බලන්නේ ගෝරම්භට කරන ලද නින්දාවට පළිගැනීම සඳහා ඔහු විසින් රජුට වැරදි වැටහීමක් ඇති කරන ලද බව දැනගත්තේය. එයින් පසු ගෝරම්භයා නිවසට ගෙන්වා ''එදින තම උත්සවයෙන් ඔහුව නෙරපන ලද්දේ රාජරාජ මහාමාත්‍යාදී ප්‍රභූවරුන් සිටින ස්ථානයක ඔවුනට අගෞරව වන ලෙස උස් ආසනයක වාඩි වී සිටි නිසා'' යනුවෙන් සිදු කළ වරද පැහැදිලි කොට වටිනා පිළිසඟලක් ප්‍රදානය කළේය. එයින් සතුටට පත් ගෝරම්භ තෙමේ රජුගේ ප්‍රසාදය නැවත දන්තිලට ලබාදෙන්නේ යැයි පොරොන්දු වූයේය. පසුදින අලුයම අමදින මොහොතේ ''අප රජුගේ අවිවේකය පුදුමයි. රජතුමා මළමූත්‍ර කරමින්ම කැකිරි අනුභව කරයි.'' යනුවෙන් කීවේය. රජතුමා පුදුමයට පත්ව ''බොල, ගෝරම්භය තැනට නොගැළපෙන දේ කියහි. තා මාලිගාවේ සේවය කරන නිසා නොමරමි. කිසියම් දිනක මා මෙවැනි කටයුත්තක හැසිරෙණු දුටුවේදැයි.'' ඇසීය. ගෝරම්භයා පෙර මෙන්ම පිළිතුරු දුණි.

රජු මේ පිළිබඳ නැවත කල්පනා කරනුයේ ''කුඩා කාලයේදීවත් එබඳු හැසිරීමක මා නොයෙදුණි. ගෝරම්භයා මත්ගතියෙන් මෙලෙස කටමැත දොඩවන්නේය. එනිසා දන්තිල විෂයෙහි කරන ලද ප්‍රකාශය ද එබඳු දෙඩවීමකි. එහෙයින් දන්තිලට කරන ලද්දේ අවැඩකියි.'' අවබෝධ කොට ගෙන දන්තිල ගෙන්වා පෙරසේම ස්වකීය පදවියෙහි සම්මාන සහිතව පිහිටු වීය'' **(Pañcatantra of Viṣṇuśarman 1912: मित्रभेदम् , 22-26).**

ඒ අනුව උක්ත කථාවේ ගෝරම්භ විසින් දන්තිල පිළිබඳ රජුගේ සිතෙහි අවිශ්වාසය ඇති කර භේද කරන අතර පසුව ඔහු ම රජුත් දන්තිලත් සමගි කිරීමට අවශ්‍ය කරන පසුබිම ද උපක්‍රමශීලී ව සකසයි.

### iii. නිල භාවය භාවිත කිරීම

සාම්ප්‍රදායිකව අනුගමනය කළ නිල බලය යොදාගෙන ජය පරාජය (Zero-Sum) ප්‍රතිඵලයක් ලැබීමේ අරමුණින් තුන්වන පාර්ශ්වයක් වන රාජ්‍යයක් නියෝජනය කරන හෝ ජාත්‍යන්තර සංවිධානයක් නියෝජනය කරන නියෝජිතයන් විසින් කරනු

ලබන තුන්වන පාර්ශ්වයේ එවැනි මැදිහත්කරණයක් නූතන ගැටුම් නිරාකරණ ක්ෂේත්‍රයේ හඳුන්වන්නේ පළමු මංපෙත ලෙසිනි. විශේෂයෙන් එහිදි නූතන ගැටුම් නිරාකරණය සඳහා මැදිහත් වන කණ්ඩායම් වර්ගීකරණය අතර ඉහළ පෙළ නායකයන්ගේ (Top Leaders) මැදිහත්වීම සිදුවිය (**කරුණාදාස, 2003: 67-77**). වර්තමානයේ විශ්වවිද්‍යාලයන්හි පරිපාලනය හා සේවකයන් මෙන්ම ශිෂ්‍යයන් අතර ඇතිවන්නා වූ ගැටුම්වලදි විශ්වවිද්‍යාලයේ උපකුලපති තුමා/තුමිය එසේ නොමැති නම් අදාළ ඇමතිවරයා මැදිහත් වී ගැටුම් නිරාකරණය කිරීම. රටවල්වල සිදුවන ගැටුම්වලදී එක්සත් ජාතීන්ගේ මහලේකම්, පාප් වහන්සේ ආදි වැදගත් පුද්ගලයන් මැදිහත් වී අවශ්‍ය විසඳුම් ලබාදීමට උත්සුක වීම).

සංස්කෘත උපදේශ සාහිත්‍යයේ දී ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු සතු නිල බලය භාවිත කරමින් ගැටුමට මුල් වී සිටින පුද්ගලයන්ට කරුණු වටහාදීමට අවශ්‍ය කරන පසුබිම සකසාදීම සිදුකරන ලද අවස්ථාවන් **පඤ්චතන්ත්‍රයේ** හා **හිතෝපදේශයේ** මිත්‍රභේද කාණ්ඩයේ සඳහන් සමුද්‍රය හා සටන් කළ කිරල කුරුල්ලාගේ කථාවෙන් මැනවින් පැහැදිලි වෙයි.

''තම බිරිඳ සමඟ එක්තරා කිරලෙක් සමුද්‍රය ආසන්නයේ ගසක වාසය කළේය. අනුක්‍රමයෙන් ගැබ්බර වූ කිරල ධේනුව දිනක් තම සැමියාට 'ප්‍රසූතය සඳහා ඉතා ළඟ ය. බිජු දැමීමට වහාම සුදුසු තැනක් සකස් කරන්න.' යැයි කීවාය. බිජු දැමීමට වෙනත් තැනක් කුමට ද පරම්පරාවෙන් අපට හිමිව ඇති මේ ගසෙහිම හිඳ බිජු දමන්න යැයි කිරලා කී ය. එය ප්‍රතික්ෂේප කරමින් 'මේ ගස සමුද්‍රය ආසන්නයේ පිහිටා තිබේ. සමුද්‍රය ඉතා දරුණු ය. කුමන මොහොතක වුව ද රැල්ලක් ගසා පැටවුන් ගසා ගන්නේ යැයි' කිරල ධේනුව පැවසී ය. එවිට කිරලා මහත් අහංකාරයෙන් 'සාගරය මා ඉතා හොඳින් හඳුනන්නේ ය. මා හට සතුරුකම් කිරීමට ඔහු එඩිතර නොවන්නේය. බිය නොවී මෙහි බිජු දමන්න යැයි' කීවේය. මෙය සාගරය ද අසාගෙන සිටියේ ය. එයින් නිර්භය වු කිරල ධේනුව ද කල් පැමිණි කල්හි එම ගසෙහිම රිකිල්ලක බැඳුණු කැදැල්ලෙහි බිජු දැමීය. සාගරය ද කිරලාගේ අහංකාරකම නැති කළයුතු යැයි කල්පනා කොට කිරල යුවළ ගොදුරු සොයා ගිය අවස්ථාවක තම රැල්ලක් අත වශයෙන් යොමු කොට කිරල බිත්තර

පැහැර ගත්තේ ය. එය දැනගත් කිරල ධේනුව කිරලාට දොස් නගමින් විලාප තියන්නට වූ අතර 'බිය නොවන්න. මගේ තුඩගින් ජලය ඉස සාගරය සිඳවන්නෙමියි' කියා කිරලා තුඩගින් ජලය ඉසින්නට විය. එය බලා සිටින කිරල ධේනුව මෙතරම් විශාල සාගරයක් නුඹට තනිවම හිස් කළ නොහැක. මිත්‍රයන්ගේ උපකාරය ලබාගන්න යැයි පවසයි. ඉන්පසු පක්ෂීන් විශාල පිරිසක් එකතුව ජලය ඉසීමට පටන් ගත්ත ද එය ද සාර්ථක නොවෙයි. ඉනික්බිති බුද්ධිමත් පක්ෂියෙකුගේ මාර්ගෝපදේශකත්වයෙන් සියලු පක්ෂීහු තම රජු වූ ගුරුළු රාජයා වෙත ගොස් 'සාගරය විසින් කුරුලු බිත්තර පැහැර ගන්නා බවත් එසේ වුවහොත් ටික කලකින් පක්ෂීන් විනාශ වී යන බවත් එයට සුදුසු පිළියමක් යොදන ලෙසත්' ඉල්ලා සිටිති.

මේ අවස්ථාවේම දේවකාර්යයක් සඳහා පිටත් වීමට අවශ්‍ය හෙයින් වහාම පැමිණෙන්න යැයි විෂ්ණු දෙවියන්ගේ පණිවුඩයක් ගත් දේව දූතයෙක් පැමිණෙයි. එම අවස්ථාවේ ගුරුළා 'විෂ්ණු දෙවියන්ගේ සේවකයා වූ මගේ යෙහෙළියකගේ බිජුවට විෂ්ණු දෙවියන්ගේ විමානය වූ සාගරය විසින් පැහැරගෙන ඇත. එනිසා සේවක වූ තමාගෙන් ප්‍රයෝජනයක් වේ නම් එයට සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා තුරු සේවයට නොපැමිණෙන්නෙමියි, පැවසූ බව විෂ්ණු දෙවියන්ට දන්වන ලෙස පවසා' දූතයාව පිටත් කර හරියි.

එම අවස්ථාවේ යහපත් සේවකයෙකු අහිමි කරගැනීම නුසුදුසු යැයි කල්පනා කරන විෂ්ණු දිව්‍ය රාජයා තෙමේම ගුරුළා හමුවට පැමිණ තොරතුරු විමසන අතර සාගරය පැහැරගත් යෙහෙළියගේ බිජුවට ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටියි. ඒ අනුව පළමුව සාගරය විසින් පැහැරගත් කිරල බිජුවට ගන්නෙමු. දෙවනුව දේවකාර්යය සඳහා දිව්‍ය ලෝකට යන්නෙමුයි. විෂ්ණු දෙවියන් ප්‍රකාශ කළේය. ගුරුළා ද මේ යෝජනාවට එකඟ වූයෙන් විෂ්ණු දෙවිරජ වහාම උරතලයෙන් රන් දුන්න අතට ගෙන අග්නි ශරයක් එහි තබා කෝපාග්නිය විහිදෙන දෑසින් සාගරය දෙස බලා 'එම්බල සාගරය, දුෂ්ටය, තා මාගේ සේවකයාගේ සේවිකාවක වූ කිරල ධේනුවගේ බිජුවට පැහැර ගත්තෙහි ය. එය ආපසු දෙව. මොහොතකදු ප්‍රමාද නොවෙ ව. වහාම මගේ අණට කීකරු නොවුවහොත් තා වියළි බවට පත්කොට නිරුදක කාන්තාරයක් කරන්නෙමි යි.' ගුගුළේය. මෙයින්

කම්පනයෙන් ප්‍රකම්පනයට පත් වූ සාගරය තෙමේ වහාම කිරල බිජු රැගෙන කිරල කැදැල්ලෙහි තැන්පත් කළේ ය'' **(Pañcatantra of Viṣṇuśarman, 1912: मित्रभेदम्, P 65-74, Hitopadeśa of Nārāyaṇa, 1967: सुहृद्भेदः , P 56-57).**

උක්ත කතාවේ කිරලා සහ සමුද්‍රය අතර ඇති වූ ගැටුම සමථයකට පත්කිරීමට මුල් වූයේ විෂ්ණු දෙවියන් ය. එහිදි විෂ්ණු දෙවියන් තමාගේ මහාත්මත්වය උපයෝගී කරගෙන සමුද්‍රය බිය ගන්වා කිරල බිජු නැවත ලබාදෙයි. මෙයින් දෙපක්ෂයටම යහපත උදාවෙයි. විශේෂයෙන් මෙහිදි කිරලා සහ සමුද්‍රය අතර ඇති වූ ගැටුම නිරාකරණය සඳහා මැදිහත්කරුවන් විශාල පිරිසකගේ සහභාගිත්වය ලැබී ඇත. ගැටුමක් නිරාකරණය කරගැනීමට කණ්ඩායම් වශයෙන් එකතු වී කටයුතු කළ යුතු ආකාරය එනම් සංවිධානගත වීම පිළිබඳ එයින් උගන්වයි. එහි ඇති විශේෂත්වය වන්නේ එක් ජන වර්ගයකට අයත් පිරිසක් තම වර්ගයේ අයෙකුට මුහුණ දීමට සිදු වූ ගැටලුව විසඳීමට මැදිහත්වීමයි. 29 (වර්තමානයේ කලාපීය වශයෙන් හා වාර්ගික වශයෙන් ඇතිවන ගැටුම් නිරාකරණය කර ගැනීමට රටවල් හා ඒ ඒ වාර්ගිකයන් එකතුවීම මෙම කථාන්දර ඇසුරින් ලත් අත්දැකීම්වලින් ඇති වූ සංකල්පයන් වශයෙන් ද තර්ක කළ හැකි වෙයි.) එයින් ගැටුමක් නිරාකරණය කරගැනීමට මැදිහත්කරුවන් වශයෙන් අපක්ෂපාති විශාල පිරිසකගේ සහභාගිත්වය ලබා ගැනීම මෙන්ම නිලතත්ත්වය භාවිත කරමින් ගැටුම් නිරාකරණය කිරීම යන න්‍යාය දෙකම භාවිත කොට ඇති බව පැහැදිලි වෙයි.

### විනිශ්චය කිරීමෙන් ගැටුම් සමථකරණය කිරීම

විනිශ්චය කිරීමෙන් ගැටුම් සමථකරණ ක්‍රියාවලිය නූතන ක්‍රමයට අනුව ජාත්‍යන්තර සාමය ආරක්ෂා කරගැනීම සඳහා ස්ථාපිත කරන ලද ජාතීන්ගේ සංගමය මගින් හඳුන්වාදෙනු ලැබීය. ඒ අනුව ජාතීන්ගේ සංගමයට අයත්වූ ඉන් පරිබාහිර ස්වාධීන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර යුක්තිය පිළිබඳ ස්ථාවර උසාවිය (Permenent Court of International Justice), එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක වූ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර උසාවිය (International Court of Justice) ආදිය ඒ සඳහා ක්‍රියාත්මක වී

ඇති ආකාරය දැකිය හැකිවෙයි (**කරුණාදාස, 2003: 67-77**). මෙහි ඇති විශේෂත්වය යම් ආරවුලක් විනිශ්චයකරණය සම්බන්ධයෙන් උක්ත අධිකරණයන් වෙත යොමු කිරීම ගැටුමට මුල් වී සිටින පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත මත රඳාපවතින අතර ඒ සඳහා කිසිඳු බලපෑමක් නැත. එමෙන්ම එයින් තීරණයක් ලබාදුන් පසු පාර්ශ්වකරුවන් එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අනිවාර්යයෙන් බැඳී සිටී.

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තොරතුරුවලට අනුව නූතන විනිශ්චයකරණ ක්‍රියාවලියට පෙර සිටම ඊට සමාන ක්‍රියාවලියක් ගැටුම් නිරාකරණය සඳහා භාවිත කර ඇති ආකාරය දක්නට ලැබේ. ඒ අනුව සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තත් ක්‍රියාවලියේ දී සිදුකරනුයේ ගැටුමට මුල් වී ඇති පාර්ශ්වකරුවන් අධිකරණයට යොමුකොට විනිසුරුවන් ලවා ගැටුමට හේතු වී ඇති කාරණාවන් විනිශ්චය කොට අපක්ෂපාතීව ඒ පිළිබඳ විමසා බලා අදාළ පාර්ශ්වකරුවන්ට කරුණු අවබෝධ කරදී ගැටුම නිරාකරණය කොට පාර්ශ්වකරුවන් අතර සමථකරණය ඇති කිරීමයි. ඒ සඳහා **පඤ්චතන්ත්‍රයේ** මිත්‍රභේද කාණ්ඩයේ සඳහන් ජීර්ණධන වෙළෙඳ පුත්‍රයාගේ කථාව උදාහරණ සපයයි.

''කිසියම් නුවරක ජීර්ණධන නම් වෙළෙඳ පුත්‍රයෙක් වෙයි. ඔහු ධන විනාශය හේතුවෙන් වෙනත් දේශයකට යන්නට සූදානම් විය. ඔහුගේ ගෙදර ඝන ලෝහයෙන් කරන ලද ආදි පුරුෂයන් විසින් සපයන ලද තරාදියක් විය. එය කිසියම් සිටුවරයෙකුගේ ගෘහයෙහි ආරක්ෂාව සඳහා තබා විදේශයකට පිටත්ව ගියේ ය. ඊට පසු බෝහෝ කාලයක් කැමති පරිදි විදේශයන්හි සැරිසරා නැවත සිය නුවරට පැමිණ ඒ සිටාණන්ට කීවේ ය. 'පින්වත් සිටුතුමනි, ආරක්ෂාව පිණිස තබා යන ලද මාගේ ඒ තරාදිය දෙනු ලැබේවා යි.' එවිට එම සිටුවරයා පින්වත, ඔබට අයත් එම තරාදිය නැත. මීයන් විසින් කන ලද්දේ යැයි පැවසී ය. එවිට ජීර්ණධන තෙමේ, 'පින්වත් සිටුතුමනි, මාගේ තරාදිය මීයන් විසින් කන ලද්දේ නම් ඔබගේ දෝෂයක් නැත. මේ සසර මෙබඳුමැයි මේ සසර නිත්‍ය වූ කිසිවක් නැත. අනෙකක් ඇත. මම ගඟෙහි නෑම පිණිස යමි. එහෙයින් ඔබතුමා ධනදේව නම් මේ ඔබගේ දරුවා නාන උපකරණ ගත් අත් ඇතිව මා සමඟ එවනු මැනවැයි' කීවේ ය. ඒ

සිටුවරයාද තමන් කළ සොරකම නිසා බියෙන් ඔහුට බිය වූයේ තම පුතාට 'දරුව, තාගේ මේ කුඩා පියා නෑම පිණිස ගඟට යන්නේ ය. එහෙයින් නෑම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ගෙන මොහු සමඟ පිටත්ව යනු ලැබේවායි' කීවේ ය.


අනතුරුව මේ වෙළෙඳ පුත්‍රයා සතුටු සිත් ඇත්තේ නෑම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය ගෙන ඒ ආගන්තුකයා සමඟ පිටත් විය. එසේ කරන ලද කල්හි වෙළෙඳ තෙමේ ස්නානය කොට ඒ බාලකයා ගංගා ගුහාවක බහා එහි දොර මහ ගලකින් වසා වහා ගෙට පැමිණියේ ඒ වෙළෙන්දා විසින් 'පින්වත් ආගන්තුකය, නුඹ සමඟ ගඟට ඒ මාගේ දරුවා කොහි දැයි කියනු ලැබේවා යි.' විචාරණ ලදි. එවිට ඒ ආගන්තුකයා ගං ඉවුරේ සිටි ඒ දරුවා උකුසකු විසින් පැහැරගෙන යන ලදැයි කීයේය. එවිට සිටුතුමා 'අසත්‍යවාදිය, කිසිතැනෙක උකුස්සෙකු විසින් ළදරුවෙකු ගෙනයන්නට කිම සමත් වෙයි ද? එහෙයින් මාගේ පුත්‍රයා ගෙනවිත් දෙව. එසේ නොකළහොත් රජුට දන්වන්නෙමි. යි' කීවේ ය. ඒ ආගන්තුකයා 'පින්වත් සත්‍යවාදිය, යම්සේ උකුස්සෙක් ළදරුවෙකු ගෙන නො යයි ද එසේම මීයෝ ද ලෝහබරින් නිමවන ලද තරාදියක් නොකති. එහෙයින් ඉදින් දරුවාගෙන් ප්‍රයෝජනයක් වේ නම් මාගේ තරාදිය නැවත දෙන්නැයි' කීවේ ය.

මෙසේ ඔවුහු දෙදෙනාම විවාද කරන්නාහු රජගෙට ගියහ. එහි දි සිටුතෙමේ උස්හඬින් කීවේය. 'පින්වත්නි, මේ සොරා විසින් මාගේ ළදරුවා පැහැරගන්නා ලදි.' අනතුරුව විනිශ්චයකාරයෝ 'පින්වත, සිටු පුත්‍රයා නැවත දෙනු ලැබේවා. යි' ඒ ආගන්තුකයාට කීහ. ඒ ආගන්තුකයා 'කුමක් කරම් ද, උකුස්සෙකු විසින් මා බලා සිටිනා විට ගං ඉවුරෙන් ළදරුවා පැහැරගෙන යන ලදි. යි කීවේ ය. එය අසා ඒ විනිශ්චයකාරයෝ කීහ. 'පින්වත, නුඹ විසින් ඇත්තක් නොකියන ලදි. උකුස්සෙක් දරුවෙකු ගෙන යන්නට කිම සමත් වෙයි ද? ඒ ආගන්තුකයා කීයේ ය. පිනවත්නි, මගේ වචනයත් අසන්න යැයි 'යම් තැනක, මීයෝ ලෝහ දහසක් වටිනා තරාදියක් කත් ද රජතුමනි, එහි උකුස්සෙක් ළමයෙකු ගෙන යන්නේයි. මෙහි සැකයක් නැතැයි' කීවේ ය.

ඔවූහු මෙය කෙසේදැයි විචාළහ. අනතුරුව සිටුවරයා සභිකයන්ගේ ඉදිරියේ මුලපටන් සියලු ප්‍රවෘත්තිය දැන්වී ය. ඉක්බිති ඒ

විනිශ්චකාරයන් විසින් සිනාසී ඔවුනොවුන්ට කරුණු අවබෝධ කොට දී තරාදිය ද ළදරුවා ද දීමෙන් ඔවුහු දෙදෙනාම සතුටු කරන ලදහ'' **(Pañcatantra of Viṣṇuśarman, 1912**: **मित्रभेदम्** , **88-89).**

උක්ත කථාවේ ජීර්ණධන සහ සිටුවරයා අතර ඇති වූ ගැටුම අධිකරණයට යොමුවීමෙන් එහි විනිසුරුවන් විසින් දෙපක්ෂයේම කරුණු හා අවශ්‍යතාවන් විනිශ්චය කොට ගැටුම නිරාකරණය කිරීමෙන් දෙදෙනාගේ අභිමතාර්ථයන් සාධනය කොට ගැටුම සමථකරණය කරන ලදි. නූතන විනිශ්චයකරණය ක්‍රියාවලියෙහි දී මෙන්ම උක්ත ගැටුම ද අධිකරණයට ඉදිරිපත් කරන අතර එය ද පාර්ශ්වකරුවන් දෙදෙනාගේ කැමැත්ත මත සිදු වී ඇත. එමෙන්ම අධිකරණයෙන් ලබාදුන් තීරණයට දෙදෙනාම බැඳී සිටීම නිසා එම තීරණය ක්‍රියාත්මක කිරීමට දෙදෙනාම කටයුතු කරති. ඒ අනුව සංස්කෘත උපදේශ සාහිත්‍යයේ දී විනිශ්චයකරණය පිළිබඳ නූතන ක්‍රියාවලිය ඒ ආකාරයෙන්ම ඉටු වී ඇතිබව පැහැදිලි වෙයි. එම ක්‍රියාවලිය සිදුවී ඇති ආකාරය රූප සටහනකින් දක්වන්නේ නම්,




සංස්කෘත උපදේශ සාහිත්‍යාගත කරුණු අනුව පාර්ශ්වකරුවන් අතර ගැටලුවක් ඇති වී එය විනිශ්චය සඳහා අධිකරණය වෙත පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත පරිදි යොමු කළ අවස්ථාවන්හි දෙන ලද තීන්දුව සමථකරණයෙන් තොරව එක් පාර්ශ්වයකට අවාසි වන අන්දමින් ලැබුණු අවස්ථාවන් ද දක්නට ලැබේ. **පඤ්චතන්ත්‍රයේ** සඳහන් ධර්මබුද්ධි සහ පාපබුද්ධි නම් මිතුරන් අතර ඇතිවූ ගැටුම එවන් අවස්ථාවකි. එහිදි පාපබුද්ධි කරන ලද වංචාව හේතුවෙන් ඔහුට මරණ දණ්ඩනය නියම වෙයි.

''එක්තරා නගරයක ධර්මබුද්ධි පාපබුද්ධි යන නම් ඇති දෙදෙනෙක් මිත්‍රව විසූහ. ධනය ඉපයීමේ ලොල් වූ මේ දෙදෙනා එක් කලෙක නගර ගම් පසුකොට එක්තරා පසල් දනව්වකට පැමිණියහ. මෙහි එක්තරා වනගත පෙදෙසක මේ දෙදෙනා ගමන් කරමින් සිටිද්දී ධර්මබුද්ධිගේ පෙර පින්බලයෙන් නිධානයක් මතුවුණේය. මෙය වනාහි තවුසෙකු විසින් වළලනු ලැබූ රන් මසු දහසකින් යුත් නිධානයකි. ඉබේම ධන සම්පත්තියක් ලැබීමෙන් සතුටු වූ මේ දෙදෙනා වැඩිදුර ගමනේ නොයෙදී මසුරන් ගුලාවත් රැගෙන සිය නගරය වෙත ආපසු පිටත් වූහ. නගරයට ආසන්න වූ පසු ධර්මබුද්ධි තම මිත්‍රයාට කථා කළේය. 'මිත්‍රය! මේ මසුරන් දහසෙන් හරි අඩක් තා සන්තකය. එය රැගෙන යනු මැනවැ' යි ඔහු කීවේය. එහෙත් ගුප්ත අධ්‍යාසයකින් යුත් පාපබුද්ධි තෙමේ ධනය ගැනීමට ඉක්මන් නොවූයේ 'මිත්‍රය! මා පවසන බස ද අසව. අප දෙදෙනා පොදුවේ මේ මසුරන් දහසට හිමිව සිටින තාක් අපේ මිත්‍රත්වයට හානි නොවන්නේය. එහෙයින් දැනට අපි මෙයින් මසුරන් සියය බැගින් ගනිමු. අනෙක් මසුරන් අටසියය අපි මෙහි පොළවේ වළලමු. අවශ්‍යතාවක් එළඹුණු කල්හි දෙදෙනා සහයෝගීව පැමිණ ඉතිරි මසුරන් සම සමව බෙදාගනිමු. අප දෙදෙනාගේ කල්‍යාණ මිත්‍රත්වය අත්හදා බැලීමට එම මසුරන් අටසීයය උරගලක් වේවා! යි' කීවේය. පාපබුද්ධියාගේ කපටි අධ්‍යාශය නොදත් ධර්මබුද්ධි එයට එකඟ වූ අතර මසුරන් සියය බැගින් ගෙන ඉතිරිය කොහොඹ ගසක් යට වළලා මිත්‍රයා සමඟ ගියේය. පාපබුද්ධි තෙමේ විවිධ දුසිරිත්හි යෙදී නොබෝ කලකින් ඒ සියලු මසු වියදම් කොට නැවත වරක් ධර්මබුද්ධි සමඟ ගොස් තවත් මසුරන් දෙසියක් රැගෙන දෙදෙනා අතර බෙදාගත්තේය. එම මුදල ද කෙටි කාලයකින් වියදම් කළ පාපබුද්ධි ධර්මබුද්ධිට නොදන්වා ඉතිරි මසුරන් හයසියයම ගත්තේය. ඉනික්බිති සති කිහිපයක් ඇවෑමෙන් පාපබුද්ධි තම මිත්‍රයා හමු වී 'නිධානයේ ඉතිරි කොටස දෙකොටසකට බෙදාගනිමු.' යැයි කීවේය. ධර්මබුද්ධි ද එයට එකඟව කොහොඹ ගස අසලට ගොස් නිධානය ගොඩ ගත්තේය. නමුත් එහි වූයේ වළං කබල පමණකි. මෙය දුටු පාපබුද්ධි තෙමේ වළං කබලෙන් හිසට ගසා ගනිමින් ළතෝනි නගමින් ධර්මබුද්ධි දෙස මරණීය බැල්මක් හෙළා 'තා මෙහි මසුරන් පැහැර ගත්තෙහි ය. මගේ කොටස වහා දෙව!' යි මොර ගෑවේය. මෙහිදී ධර්මබුද්ධි තෙමේ, 'තා මාහට අස්ථානයේ දොස් නගන්නෙහි ද? වංචනික, කපට ද්‍රෝහි ක්‍රියාවන්හි යෙදීම මාගේ ප්‍රතිපත්තිය

නොවේ' යි කීවේය. මෙලෙස දෙදෙනා බහින් බස් වී අවසානයේ අධිකරණ නායකයා හමු වී සියලු පුවත් ප්‍රකාශ කළහ. අධිකරණ නායකයා දෙදෙනා පිළිබඳවම විශ්වාස නොකොට දෙදෙනාම වධ බන්ධනයට ලක් කළේය. එවිට පාපබුද්ධි තෙම 'අහෝ! විනිශ්චය ඉතා අසාධාරණය. මම නිර්දෝෂී වෙමි. ඉතිරි මසුරන් පැහැර ගත්තේ මේ ධර්මබුද්ධි ය. එය මම රුක් දෙවියෙකුගේ මුවින් ඔප්පු කරන්නෙමි'යි කීය. 'එසේ ඔප්පු කළහොත් තා වධ බන්ධනයෙන් මුදවන බවත්, තෙපි දෙදෙන නිධානය තිබූ තැනට තමන් කැටුව යා යුතු බවත් ' පවසා අධිකරණ නායකයා එයට එකඟ විය.

එයිනික්බිති පාපබුද්ධි තෙමේ සිය නිවසට ගොස් තම පියා කැඳවා, 'මසුරන් හයසිය මා සමීපයේය. නමුත් එය ධර්මබුද්ධි ගත්තේ යැයි අධිකරණ නායකයාට ඔප්පු කළ යුතුය. එයට ඔබගේ අනුග්‍රහය අවශ්‍ය වේ. එනිසා අද රාත්‍රියේ මා ඔබව නිධානය තිබූ තැන ඇති රුක් බෙණයක සඟවන්නෙමි. පසුදින අධිකරණ නායකයා සමඟ අප පැමිණි කල්හි එහි සිට මසුරන් සොරාගත්තේ ධර්මබුද්ධි යැයි පැවසිය යුතු බව' ප්‍රකාශ කළේය. කරන්නට යන කටයුත්තෙහි නරක ආදීනව ඇතිවිය හැකි බව පියා පැවසුවද එය නොපිළිගත් පාපබුද්ධි තෙම තම පියා ගස් බෙණයෙහි සැඟවීය.

පසුදින අලුයම මිත්‍රයන් දෙදෙනා අධිකරණ නායකයා සමඟ නිධානය තිබූ තැනට ගිය අතර නා පිරිසිදු වී සිටි පාපබුද්ධි තෙමේ අහස දෙස බලමින් කඳුළු වගුරුවමින් මසුරන් ගත් සොරා කවරෙක් දැයි පවසන ලෙස රුක් දෙවතාවුන්ට කන්නලව් කරන්නට විය. එවිට ගස් බෙණයේ සැඟවී සිටි පාපබුද්ධිගේ පියා මසුරන් හයසිය සොරා ගත්තේ ධර්මබුද්ධි බවත් පාපබුද්ධි නිවැරදි බවත් පැවසීය. මෙය ඇසූ අධිකරණ නායකයා මෙම සොරාට කුමක් කළ යුතු දැයි කල්පනා කරන අතරතුර ධර්මබුද්ධි තෙමේ අසල තිබූ පිදුරු ගොඩක් ගෙන ගස් බෙණයට බහා ගිනි තැබීය. ටික වේලාවකින් පිලිස්සුණ අඟ පසඟ ඇති පාපබුද්ධිගේ පියා ගස් බෙණයෙන් එළියට පැන්නේය. මෙය දුටු අධිකරණ නායකයා 'මේ මොක ද මේ ? යැයි' විස්මයෙන් ඇසීය. එහිදී පාපබුද්ධිගේ පියා, සිය පුතා කළ කී දෑ සියල්ල පැවසූ අතර අධිකරණ නායකයා ඔහුට මරණ දණ්ඩනය නියම කොට ධර්මබුද්ධිට රාජ වරප්‍රසාද ලබාදුණි'' **(Pañcatantra of Viṣṇuśarman, 1912: मित्रभेदम्, 84-86).**

ඒ අනුව විනිශ්චය කිරීමෙන් ගැටුම් සමථකරණය හා සබැඳි නූතන හා සංස්කෘත උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදය පහත දැක්වෙන අයුරින් සම්පිණ්ඩනය කළ හැකිය.

| ක්‍රමවේදය | මැදිහත්වන ආකාරය | විනිශ්චායතනය | විශේෂත්වය |
| --- | --- | --- | --- |
| නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදය | පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත මත ආරවුල් යොමු කෙරේ. | ජාත්‍යන්තර යුක්තිය පිළිබඳ ස්ථාවර උසාවිය (Permenent Court of International Justice), එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක වූ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර උසාවිය (International Court of Justice) | අධිකරණ බලය හිමිව ඇත.<br>විනිසුරු මඩුල්ලකින් යුක්තය.<br>තීරණයක් ලබාදුන් පසු පාර්ශ්වකරුවන් එයට බැඳී සිටි. |
| උපදේශ සාහිත්‍යාගත ක්‍රමවේදය | පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත මත ආරවුල් යොමුකර ඇත. | ධර්මාධිකරණය | රජුට සම්බන්ධ හෙයින් අධිකරණ බලය හිමිව ඇත.<br>විනිසුරු මඩුල්ලකින් යුක්තය.<br>තීරණයක් ලබාදුන් පසු පාර්ශ්වකරුවන් එයට බැඳී සිටි. |

මෙනයින් උක්ත කරුණු අනුව සලකා බලන විට ගැටුම් නිරාකරණය පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත මැදිහත්කරණ (Mediation) න්‍යායයෙහි ස්වරූපය යම් තරමකින් විග්‍රහ කරගත හැකි අතර එහිලා නූතන මැදිහත්කරණ ක්‍රියාවලිය සමඟ දක්නට ලැබෙන සමතාවන් හා සුවිශේෂී වෙනස්කම් ද හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඩබ්ලිව්.එම්. කරුණාදාස, **ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්,** (දෙහිවලඃ ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, 2003)

Jayadeva Uyangoda, ***Conflict Negotiation Mediation and Peace,*** (Colombo: Social Scientists Association, 2003)

ගාමිණී සමරනායක, ''සමාජ ගැටුම් නිර්වචනය සහ ස්වභාවය'', **ගැටුම් නිරාකරණය න්‍යාය හා භාවිතය**, (සංස්ඃ) රංජිත් දික්වැල්ල, රේණුක ප්‍රියන්ත, ශිරානි හෙට්ටිආරච්චි ආදීහු, (වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ, 2003)

Experiences from Conflict Resolution in the Third World, (ed.), Goran Lindgren, Kjell Ake Nordquist and Peter Wallensteen, (Upusala University, Department of Peace and Conflict Research, 1993)

"Conflict Resolution and Coflict Transformation" New Direction in Conflict Theory, (ed.), Raimo Vayryen, (London, Saga Publishers, 1991)

හොරණ ධම්මින්ද හිමි, ''ගැටුම් නිරාකරණයෙහිලා තෙවැනි පාර්ශ්වයේ කාර්යභාරය'', ගැටුම් නිරාකරණය න්‍යාය හා භාවිතය, (සංස්ඃ) රංජිත් දික්වැල්ල, රේණුක ප්‍රියන්ත, ශිරානි හෙට්ටිආරච්චි ආදීහු, (වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ, 2003)

Pañcatantra of Viṣṇuśarman,(ed.), M.R Kale,(Delhi: Motilal Banarsidass, 1912)

**කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය**, දෙවන කොටස, (සංස්.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, (කොළඹඃ ඇස් ගොඩගේ සහෝදරයෝ, 2003)

**Hitopadeśa of Nārāyaṇa**, (ed.), M.R. Kale, (Bombay: Gopal Narayana & Co.1967)

**හිතෝපදේශය**, (පරි.), හල්දොල විමලකිත්ති හිමි, (කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, වර්ෂය නොමැත)